# ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
## වාර්ෂික කාර්යසාධන වාර්තාව - 2018

රාජ්‍ය මුදල් චක්‍රලේඛ අංක : 402 අනුව පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කිරීම සඳහා පිළියෙල කරන ලදී.

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
පැලවත්ත, බත්තරමුල්ල

# පටුන

පිටු අංක


| | | | |
|---|---|---|---|
| 1. | 1.1. | හැඳින්වීම | 3 |
| | 1.2. | විභාග කොමසාරිස් ජනරාල්ගේ පණිවුඩය | 4 |
| | 1.3. | ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුවේ දැක්ම සහ මෙහෙවර | 5 |
| | 1.4. | විභාග දෙපාර්තමේන්තුවේ ගමන් මග | 6 - 10 |
| 2. | විභාග දෙපාර්තමේන්තුවේ කාර්යභාරය | | 11 - 13 |
| | 2.1 | පාසල් විභාග සංවිධාන හා ප්‍රතිඵල ශාඛාව | 14 - 15 |
| | 2.2 | රහස්‍ය (පාසල් විභාග) ශාඛාව | 15 - 16 |
| | 2.3 | ඇගයීම් (පාසල් විභාග) ශාඛාව | 16 - 18 |
| | 2.4 | විමර්ශන ශාඛාව | 18 - 19 |
| | 2.5 | සහතික පත්‍ර ශාඛාව | 19 - 22 |
| | 2.6 | පර්යේෂණ හා සංවර්ධන ශාඛාව | 23 - 26 |
| | 2.7 | සංවිධාන හා විදේශ විභාග ශාඛාව | 26 - 28 |
| | 2.8 | රහස්‍ය (ආයතනික විභාග) ශාඛාව | 29 |
| | 2.9 | ඇගයීම් (ආයතනික විභාග) ශාඛාව | 30 |
| | 2.10 | ප්‍රතිඵල (ආයතනික විභාග) ශාඛාව | 30 - 31 |
| | 2.11 | ආයතන ශාඛාව | 31 |
| | 2.12 | තැපැල් ශාඛාව | 32 |
| | 2.13 | ගිණුම් ශාඛාව | 32 - 34 |
| | 2.14 | සැපයීම් ශාඛාව | 34 - 35 |
| | 2.15 | මුද්‍රණාලය | |
| | | 2.15.1 මුද්‍රණාලය (රහස්‍ය) | 35 - 36 |
| | | 2.15.2 මුද්‍රණාලය (රහස්‍ය නොවන) | 36 - 37 |
| | 2.16 | පරිගණක ශාඛාව | 37 - 39 |
| | 2.17 | දත්ත සටහන් ශාඛාව | 40 |
| | 2.18 | සැලසුම් ක්‍රියාත්මක කිරීමේ හා නියාමන ශාඛාව | 40 - 41 |

# හැඳින්වීම

රටක සංවර්ධන ඉලක්ක සපුරා ගැනීමට හා අනාගත අභියෝග ජයගැනීමට මූලික අඩිතාලම සපයනු ලබන්නේ අධ්‍යාපනයයි. අධ්‍යාපන අරමුණු, අභිමතාර්ථ හා නිපුණතා ඵල ගැන්වීමෙහි ලා ඇගයීම් සහ තක්සේරුකරණ ක්‍රියාවලිය තුළින් විශිෂ්ට සේවාවක් සිදුවේ.

ඇගයුම් හා තක්සේරුකරණ ක්‍රියාවලිය මගින් දේශයේ අනාගත සංවර්ධනය උදෙසා අවශ්‍ය මානව සම්පත තෝරා බේරා දීමේ උදාර කර්තව්‍යය ජාතික ඇගයීම් හා පරීක්ෂණ සේවාවක් ලෙස විභාග දෙපාර්තමේන්තුව මගින් සිදු කරනු ලබයි. ලක්ෂ සංඛ්‍යාත ජනතාවගේ විශ්වාසය දිනා ගනිමින් සෑම විභාගයක්ම ඉතාම ඉහළ විශ්වසනීයතාවකින් සහ වලංගුතාවකින් සිදු කිරීමේ මෙහෙවර අතැතිව ජාතියේ බුද්ධි ප්‍රභාවය මෙහෙයවන ආයතනයක් ලෙස මෙම දෙපාර්තමේන්තුව හැඳින්විය හැකිය.

තාක්ෂණයේ දියුණුවත් සමග දිනෙන් දින වෙනස්වන ලෝකය තුළ ඉහළ ගුණාත්මක බවකින්, විශ්වසනීයතාව ආරක්ෂා වන පරිදි සැමට සාධාරණ ලෙස විභාග පැවැත්වීම අභියෝගයකි. එම අභියෝග ජයගෙන ජාත්‍යන්තර ප්‍රමිතිවලට අනුව විභාග පැවැත්වීමේ ප්‍රතිඵලයක් ලෙස ශ්‍රී ලංකා විභාග සහතික ලෝකයේ ඉතා ඉහළ පිළිගැනීමකට පත්ව තිබේ.

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව, නවීන ලෝකයට ගැළපෙන තාක්ෂණය උකහා ගනිමින් ජනතාවට කාර්යක්ෂම සේවාවක් සපයන ඇගයුම් හා තක්සේරුකරණ ප්‍රමිතීන් කරා ළඟා වූ විශිෂ්ට රාජ්‍ය ආයතනයක් වශයෙන් ජාතික මෙන්ම ජාත්‍යන්තර තලයේ පිළිගැනීමට ලක්ව තිබෙන ආයතනයක් වශයෙන් හඳුන්වා දිය හැකිය.

# විභාග කොමසාරිස් ජනරාල්ගේ පණිවිඩය

අධ්‍යාපනය රටක අනාගත සංවර්ධන ක්‍රියාදාමයේ මූලික පදනම වේ. අනාගත අභියෝගයන් ජය ගැනීමට සමත්, සමබර පෞරුෂයකින් හා තාක්ෂණයෙන් සවිබල ගැන්වූ නිපුණතාවන්ගෙන් පිරි දරු පරපුරක් බිහි කිරීම උදෙසා ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුවෙන් සිදුවන මෙහෙවර විශිෂ්ට වේ. ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය අවසානයේ ශිෂ්‍ය සාධනය තක්සේරුකරණය සේම රාජ්‍ය සේවයේ බඳවා ගැනීම්, උසස් කිරීම් හා කාර්යක්ෂමතා කඩඉම් විභාග ද ඉතා ඉහළ විශ්වසනීයතාවකින් හා නිරවද්‍ය ලෙස පවත්වා ප්‍රතිඵල සහතිකකරණය කිරීමද අපගේ ප්‍රධාන වගකීමකි.

2018 වර්ෂයේදී අප අත්පත් කරගත් ජයග්‍රහණ රාශියකි. මෙම කාර්යසාධන වාර්තාව අපගේ ප්‍රගමනයන් හා අපගමනයන් පිළිබඳව පැහැදිලි විග්‍රහයක් කර ඇත.

නවීන තාක්ෂණ භාවිතය හා ඩිජිටල්කරණය තුළින් වඩාත් කාර්යක්ෂම සේවාවක් මහජනතාවට ලබා දීම උදෙසා නව වැඩසටහන් රාශියක් ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව ක්‍රියාවට නංවා ඇති අතර එහි ප්‍රතිලාභ දැනටමත් ජනතාව වෙත ලැබෙමින් පවතී.

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව නිශ්චිත කාලරාමුවක් තුළ ඉලක්කගත අරමුණු ඵලදායී ලෙස සපුරා ගෙන ඇත. දෙපාර්තමේන්තුව සතු සුවිශේෂී ලක්ෂණය වන්නේ කැපවීම්, අරමුණු සාධනය හා වෘත්තීය නිපුණත්වයෙන් සපිරි සාමූහිකව වගවීමේ ක්‍රියාදාමයයි.

2018 වර්ෂයේදී ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව අභියෝග ජයගනිමින් විශිෂ්ටත්වය කරා මෙහෙයවීමට නායකත්වය ලබා දීමට හැකිවීම පිළිබඳව මම අතිශයින් සතුටු වෙමි. ඒ වෙනුවෙන් මට ශක්තිය ලබාදුන් සියලු දෙනාටම මාගේ කෘතඥතාව පළ කරමි. 21 වැනි සියවසේ සහශ්‍ර අධ්‍යාපන ඉලක්කයන් සපුරා ගැනීමෙහිලා ඇගයීම් ක්‍රියාවලිය හා තක්සේරුකරණය තවදුරටත් නවීකරණය විය යුතු බව මාගේ විශ්වාසය යි. ජාතික ඇගයීම් හා තක්සේරුකරණ සේවාව යටතේ කරනු ලබන ජාතික මෙහෙවර තවදුරටත් පුළුල් කිරීමටත් අර්ථවත් කිරීමටත් පියවර ගැනීමට අපේක්ෂා කරන අතර ඒ සඳහා අවශ්‍ය සියලු ක්‍රමෝපායන් ඔස්සේ සාධනීය හා ගුණාත්මක සංවර්ධනයක් ඉටු කිරීම අපගේ ඉදිරි අපේක්ෂාවයි.

බී. සනත් පූජිත
විභාග කොමසාරිස් ජනරාල්

## දැක්ම

ඇගයීම් ක්‍රමවේද සහ භාවිත විශිෂ්ට ලෙස යොදා ගනිමින් ද, වෙනත් විවිධ පරීක්ෂණ කාර්යයන් හැසිරවීම තුළින් ද, ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය වැඩි දියුණු කිරීම සඳහා නායකත්වය සැපයීම

## මෙහෙවර

ජාතික අවශ්‍යතාවලට ගැළපෙන සේ විශ්වසනීයතාව හා වලංගුතාව ආරක්ෂා වන පරිදි සකස් කරනු ලබන ඇගයීම් උපකරණ හා ක්‍රම ශිල්ප මගින් අධ්‍යාපනික සාධනය හා සහතිකකරණය පිළිබඳ ක්‍රියාකාරකම් විශිෂ්ටත්වය කරා මෙහෙයවීම.

# ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුවේ ගමන් මග

ශ්‍රී ලංකාවේ විභාග පැවැත්වීම සම්බන්ධයෙන් දිගු ඉතිහාසයක් ඇත. 1869 පෙබරවාරි මාසයේදී ''ප්‍රසිද්ධ ඉගැන්වීම් දෙපාර්තමේන්තුව'' ආරම්භ කළ අතර අධ්‍යාපනයේ සම්පූර්ණ පාලනය එයට පැවරිණි. ආරම්භයේදී විභාග පැවැත්වීම සම්බන්ධව වගකීම දැරුවේ ප්‍රසිද්ධ ඉගැන්වීම් දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂවරයා වන අතර, පසුකාලීනව විභාග සඳහා පත් කළ විභාග අධිකාරිවරයෙකු යටතේ අධ්‍යාපන දෙපාර්තමේන්තුවේ විභාග සඳහා වෙනම ශාඛාවක් පිහිටුවන ලදි. වසරින් වසර විභාග සංඛ්‍යාව හා අපේක්ෂකයින් සංඛ්‍යාව වැඩි වූ හෙයින් එවකට පැවති විභාග ශාඛාවට එම විශාල කාර්යභාරය ඉටු කිරීමට විවිධ අපහසුතා ඇති විය. එමනිසා 1951 ඔක්තෝබර් මස 01 දින විභාග කොමසාරිස්වරයෙකු යටතේ ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව නමින් වෙනම දෙපාර්තමේන්තුවක් ආරම්භ කරන ලදී.

ලංකා ඉතිහාසයේ ප්‍රථම ප්‍රසිද්ධ විභාගය පවත්වා ඇත්තේ 1862 රාජ්‍ය සේවයේ කණිෂ්ඨ සේවක තනතුරුවල පුරප්පාඩු සම්පූර්ණ කිරීම සඳහා ය. මෙම විභාගය හා සම්බන්ධ සියලු පාලන කටයුතු පැවරී තිබුණේ 1834 දී පිහිටුවන ලද මධ්‍යම පාඨශාලා කොමිසම වෙත ය.

ලංකාවේ ප්‍රධාන පෙළේ පාසල්වල ශිෂ්‍යයන් පමණක් පෙනී සිටි ප්‍රසිද්ධ දේශීය විභාගයක් 1862 වර්ෂයේදී පැවැත් වූ අතර එයට සහභාගි වූ අයදුම්කරුවන් සංඛ්‍යාව 1862 වර්ෂයේ සිට 1868 වර්ෂය තෙක් ක්‍රමයෙන් වැඩි වුවත් පසුව සීඝ්‍රයෙන් අඩුවන තත්ත්වයක් දැකිය හැකි වූ නිසා එයට පිළියමක් ලෙස කේම්බ්‍රිජ් විභාග පිළිබඳ දේශීය පාලක මණ්ඩලයේ ද ලන්ඩන් විශ්වවිද්‍යාලයේ ද විභාග ලංකාවේ පැවැත්වීම සඳහා රජයේ අධ්‍යාපන මණ්ඩලයේ අධ්‍යක්ෂ විසින් කටයුතු කරන ලදි.

පළමුවන කේම්බ්‍රිජ් දේශීය විභාගය 1880 වසරේදී පවත්වන ලදි. පසුව 1916 දී ''කේම්බ්‍රිජ් ජ්‍යෙෂ්ඨ'' විභාගය ආරම්භ කළ අතර 1882 වර්ෂයේ ජනවාරි හා ජූනි මාසවලදී ප්‍රථම වතාවට ලන්ඩන් මැට්‍රිකියුලේෂන් විභාගය පවත්වා ඇත. 1952 නොවැම්බර් මාසයේ ප්‍රථම වතාවට ලන්ඩන් අ.පො.ස. (උසස් පෙළ) විභාගය ශ්‍රී ලංකාවේ පවත්වා ඇත.

රජයේ ගුරුවරුන් බඳවා ගැනීම සඳහා ස්වභාෂා ගුරු සහතික පත්‍ර විභාගය 1878 වර්ෂයේදී මුලින්ම පවත්වා ඇත. ඉංග්‍රීසි ගුරුවරුන් සඳහා 1910 දී රජයේ ගුරු අභ්‍යාස විද්‍යාලයක් පළමුවන වරට ආරම්භ කළ අතර වර්ෂාවසානයේ පැවැත් වූ විභාග සමත් ගුරුවරුන්ට ඉංග්‍රීසි පුහුණු II පෙළ සහතිකය ප්‍රදානය කර ඇත. 1929 වසරේදී ප්‍රථම වතාවට ''ප්‍රාරම්භ ගුරු විභාගය'' පවත්වන ලදී.

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව 1952 වර්ෂයේ නිකුත් කළ පාලන වාර්තාවට අනුව එම වර්ෂයේදී දේශීය විභාග 08ක් සහ විදේශ විභාග 27ක් පවත්වා ඇත.

1968 අංක 25 දරන ප්‍රසිද්ධ විභාග පනත මගින් පොදු අධ්‍යයන විභාග (පාසල් විභාග), කාර්මික අධ්‍යාපන ආයතන විභාග, රජයේ හෝ රජයෙන් ආධාර ලබන ආයතන සඳහා පවත්වන විභාග ඇතුළු සියලු ප්‍රසිද්ධ විභාග සංවිධානය කොට පැවැත්වීමේ බලය විභාග දෙපාර්තමේන්තුවට ලැබී ඇත.

1960 දශකයේ අග භාගයේ මෙම දෙපාර්තමේන්තුවේ දත්ත සැකසුම් ශාඛාව නමින් නව ශාඛාවක් ආරම්භ කළ අතර දෙපාර්තමේන්තුවට අයත් පරිගණක අංශයක් එවකට නොතිබුණු බැවින් රාජ්‍ය ඉංජිනේරු සංස්ථාවේ පරිගණක අංශය හා පසුව ශ්‍රී ලංකා මහ බැංකුවේ පරිගණක අංශය මගින් මෙහි කාර්යයන් සිදු කර ඇත. 1969 වර්ෂය වන විට වැඩසටහන් සම්පාදනය ඇතුළු දත්ත සැකසීමේ සියලු කටයුතු විභාග දෙපාර්තමේන්තුව තුළදීම සිදු කරගත හැකි පරිදි පරිගණක අංශයක් ස්ථාපිත කොට ඇත.

නවීන තාක්ෂණයත් සමග යා වෙමින් ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව කාර්යක්ෂම සේවයක් ලබා දීම සඳහා පරිගණක පද්ධතියක් පිහිටුවා ආයතනය තුළදීම සියලු පරිගණක කටයුතු සිදු කිරීම ආරම්භ කිරීම මහත් ජයග්‍රහණයකි. එමෙන්ම ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව සතුව ආරම්භයේ සිටම මුද්‍රණාලයක් පැවති අතර වර්තමානයේ ඩිජිටල් තාක්ෂණය යොදා ගනිමින් වඩාත් කාර්යක්ෂම හා ඉහළ ගුණාත්මක බවකින් යුක්ත මුද්‍රණ කටයුතු සිදු කිරීමට හැකි මුද්‍රණාලයක් බවට දියුණු වී ඇත. තාක්ෂණයත් සමග අත්වැල් බැඳගනිමින්, පාසල් විභාගවල ප්‍රතිඵල අන්තර්ජාලය ඔස්සේ නිකුත් කිරීමට කටයුතු කිරීම තුළින් දසත විහිදී ඇති ලක්ෂ සංඛ්‍යාත සිසුන්හට ඉමහත් වාසියක් ලැබිණි.

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුවේ නම කියූ පමණින් මැලේ වීදිය ඕනෑම අයෙකුගේ සිහියට නැගේ. එයින් ආරම්භ වූ ගමන බත්තරමුල්ල, පැලවත්තේ සුවිසල් ගොඩනැගිලි සංකීර්ණයකට ගෙන ඒම විශාල ජයග්‍රහණයකි.

සියලුම ප්‍රශ්න පත්‍ර ඇගයීම් කටයුතු සම්මේලන ක්‍රමයට ආරම්භ කිරීම මගින් එය වඩා විධිමත් හා නිවැරදි ක්‍රමයකට ගෙන ඒමට හැකිවීම ඇගයීම් ක්ෂේත්‍රයේ සිදු වූ විශාල පරිවර්තනයකි. විභාග පැවැත්වීමෙන් ඔබ්බට ගොස් ජාත්‍යන්තර වශයෙන් ඇගයීම් සිදු කරන ආකාරය සලකා බලා පාසල පදනම් කර ගත් ඇගයීම් ක්‍රමයක් ආරම්භ කිරීමත් එය වඩාත් ප්‍රචලිත කිරීමට ක්‍රමවේද සකස් කිරීම, ඇගයුම් උපකරණ හඳුන්වාදීම, නිදර්ශන සැපයීම, පුහුණුකරුවන් හා ඇගයුම්කරුවන් පුහුණු කිරීම ආදිය සිදු කිරීමත් මගින් දෙපාර්තමේන්තුව පාසලට වඩාත් සමීපව කටයුතු කරන ආයතනයක් බවට පත් විය. එම ඇගයීම් නිපුණතා මට්ටම්

සහතිකයට ඇතුළත් කිරීමට කටයුතු කිරීම පාසල පදනම් කරගත් ඇගයීම වඩාත් ශක්තිමත් කිරීමට හේතු විය.

අපි ආ ගමන් මගෙහි ලබාගත් වැදගත් ජයග්‍රහණයක් ලෙස සහතිකකරණ ක්‍රියාවලිය විධිමත් කිරීම හඳුන්වාදිය හැකි ය. මෙහිදී අධ්‍යාපන සහතික ඉතා ඉහළ ගුණාත්මක බවකින් යුතුව මුද්‍රණය කොට එක් දින සේවය යටතේ සහ සාමාන්‍ය සේවය යටතේ ලබා දීමට කටයුතු කිරීම විශේෂත්වයකි. දෛනිකව විශාල පිරිසක් මේ සේවාව යටතේ ප්‍රයෝජන ලබා ගන්නා අතර විදේශ අධ්‍යාපනය සඳහා සහ විදේශ රැකියා සඳහා අයදුම්කරන්නන්ට විශාල පහසුවක් මෙමගින් ලැබී ඇත.

විභාග පැවැත්වීමෙන් සීමා නොවූ ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව පාසල් පද්ධතියේ සිසු සංවර්ධනයට අවශ්‍ය පියවර ගණනාවක් මේ වන විට ගෙන ඇත. කලාප, පළාත් මට්ටමින් ප්‍රතිඵල විශ්ලේෂණය කර සෑම විෂයයක් සම්බන්ධයෙන්ම එම විශ්ලේෂණ වාර්තා සකස් කරනු ලබන අතර ඒ මගින් සිසුන්ගේ සංවර්ධනය පිළිබඳ වඩාත් අර්ථාන්විතව තීරණ ගැනීමට හැකියාව උදා වේ.

පාසල් විභාගවල ගුණාත්මකභාවය වර්ධනය කිරීම සඳහා පූර්ව පරීක්ෂණයට (Pre-Test) භාජනය කරන ලද ප්‍රශ්න ඇතුළත් අයිතම බැංකුවක් ස්ථාපනය කිරීමට කටයුතු කර ඇති අතර මේ වන විට අ.පො.ස. (සා.පෙළ) හා අ.පො.ස. (උ.පෙළ) විභාගවල දී එම ප්‍රශ්න යොදා ගැනීමට හැකි මට්ටමට සංවර්ධනය වී ඇත.

විභාග පැවැත්වීමට හා ඇගයීම් කටයුතු සිදු කිරීමට පාසල් පද්ධතියේ බොහෝ පාසල් සති අන්තයේ පමණක් යොදා ගැනීමට සිදුවීම, ප්‍රතිඵල නිකුත් කිරීමේ කාර්යක්ෂමතාව ඉහළ නැංවීමට බාධාකාරී ලෙස බලපා ඇත. සතියේ දිනවල විභාග පැවැත්වීමේ සහ පිළිතුරුපත් ඇගයීමේ කටයුතු සඳහා විභාග දෙපාර්තමේන්තු පරිශ්‍රයේ බහුකාර්යය ගොඩනැගිලි සංකීර්ණයක් ඉදි කිරීමේ කටයුතු ආරම්භ කර ඇති අතර තවත් මාස කිහිපයකින් මෙම ගොඩනැගිල්ලේ කටයුතු නිම කිරීමට නියමිතය. එමගින් දෙපාර්තමේන්තුවේ කාර්යභාරය වඩාත් කාර්යක්ෂම කිරීම මගින් මහජනතාවට ගුණාත්මක සේවයක් ලබා දීම අපේක්ෂා කෙරේ.

තොරතුරු තාක්ෂණය භාවිතයේ විශිෂ්ටත්වය පිළිබිඹු කරමින් විදුලි සංදේශ හා තොරතුරු තාක්ෂණ අමාත්‍යාංශය යටතේ ඇති ශ්‍රී ලංකා තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ ආයතනය මගින් ඇගයීමට ලක් කරන ලද ''National Best E-Content Award'' ලංකාවේ රාජ්‍ය හා පෞද්ගලික ආයතන අතුරින් විශිෂ්ටතම ආයතනයක් වශයෙන් ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව ''ස්වාභිමානී 2014'' සම්මානයෙන් පිදුම් ලැබීය. එහි තවත් පියවරක් ඉදිරියට තබමින් මාර්ගගත ක්‍රමයට (online) විභාග අයදුම්පත්‍ර ලබා ගැනීමටත්, විභාග පැවැත්වීමටත් එමගින්

ජාත්‍යන්තර ප්‍රමිතිවලට අවශ්‍ය නවීන තාක්ෂණික ඇගයුම් ක්‍රමවේද යොදා ගැනීමටත් සැලසුම් කර ඇත.

රාජ්‍ය ගිණුම් කාරක සභාව මගින් රාජ්‍ය ආයතන 38ක් අතුරින් කරන ලද සමීක්ෂණයකට අනුව දූෂණ අක්‍රමිකතාවලින් තොරව නවීන ලෝකයට ගැලපෙන තාක්ෂණය උකහා ගනිමින් ජනතාවට කාර්යක්ෂම සේවාවක් සපයන විශිෂ්ටතම රාජ්‍ය ආයතනය බවට ප්‍රකාශයට පත් කිරීම 2017 වර්ෂයේ ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව ලබා ගත් සුවිශේෂී ජයග්‍රහණයක් වශයෙන් හඳුන්වා දිය හැකිය.

රාජ්‍ය තිරසාර සංවර්ධන වැඩපිළිවෙලට ඉමහත් දායකත්වයක් ලබා දෙමින් ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තු ගොඩනැගිලි සංකීර්ණය තුළ කිලෝ වොට් 250ක ධාරිතාවකින් යුතු සූර්ය බලශක්ති ව්‍යාපෘතිය සඳහා විදුලිබල හා පුනර්ජනනීය බලශක්ති අමාත්‍යාංශයේ අනුග්‍රහය මත රාජ්‍ය ආයතනයක ඉදිවුණු විශාලතම සූර්ය පැනල පද්ධතිය බිහි කිරීමට යොමු වීම 2017 වර්ෂය තුළ දෙපාර්තමේන්තුව ලබාගත් විශාල ජයග්‍රහණයකි.

ප්‍රශ්නපත්‍ර මුද්‍රණ කටයුතුවල ගුණාත්මකභාවය හා කාර්යක්ෂමතාව වඩාත් ඉහළ නැංවීම සඳහා ස්වයංක්‍රීයව ක්‍රියාත්මක වන “Turn Key Web” මුද්‍රණ යන්ත්‍රය ස්ථාපනය කරන ලද අතර, 2018 වර්ෂයේදී මෙම යන්ත්‍රය යොදා ගනිමින් ප්‍රශ්නපත්‍ර මුද්‍රණය කර ගැනීමට හැකි වීම මුද්‍රණ කටයුතු සම්බන්ධයෙන් තැබූ ඉදිරි පියවරක් වශයෙන් හඳුන්වා දිය හැකිය.

රාජ්‍ය ආයතනවලට මෙන්ම අර්ධ රාජ්‍ය හා පෞද්ගලික ආයතන සඳහා ද බඳවා ගන්නා ලද සේවකයන්ගේ ප්‍රතිඵල සනාථ කිරීම විභාග දෙපාර්තමේන්තුව මගින් සිදු කරනු ලබන අතර වාර්ෂිකව විශාල සහතිකපත් ප්‍රමාණයක් විවිධ ආයතන මගින් සනාථ කිරීම සඳහා යොමු කරනු ලබයි. මෙම සංඛ්‍යාව වැඩිවීම හේතුවෙන් ප්‍රතිඵල සනාථ කිරීමේ ප්‍රමාදයක් සිදුවීම වළක්වා ගැනීම සඳහා මාර්ගගත ක්‍රමය මගින් විභාග ප්‍රතිඵල සනාථ කිරීමේ අවස්ථාව කලාප අධ්‍යාපන කාර්යාල සහ අධ්‍යාපන අමාත්‍යාංශය වෙත ලබා දීම තුළින් මෙම ක්‍රියාවලියේ කාර්යක්ෂමතාව වැඩි කර ගැනීමට හේතුවිය. මෙම කාර්යයන් විභාග දෙපාර්තමේන්තුව මගින් විගණනයට ලක් වීම නිසා මෙහි රහස්‍යතාව ආරක්ෂා කර ගැනීමට හැකිවීම හේතුවෙන් මෙම ක්‍රමවේදය ඉතා සාර්ථක ප්‍රතිඵල ගෙන දෙන්නක් විය. ඉදිරියේදී රාජ්‍ය අංශය සඳහා මෙම සේවාවන් ව්‍යාප්ත කිරීමට අපේක්ෂා කරයි.

සන්නිවේදන තාක්ෂණයේ දියුණුවත් සමඟ ම ජාත්‍යන්තර තලයේ විභාග මාර්ගගත ක්‍රමයට (Online) පැවැත්වීම වඩාත් කාර්යක්ෂම ක්‍රමවේදයක් බවට පත්ව ඇති බැවින් ශ්‍රී ලංකා විභාග ඉතිහාසයේ පළමු වතාවට මාර්ගගත ක්‍රමයට විභාග පැවැත්වීම සඳහා 2018 වර්ෂයේදී පියවර ගන්නා ලදී. ඒ අනුව, 12 වන ශ්‍රේණියේ අධ්‍යාපනය ලබන සිසුන් සඳහා පවත්වනු ලබන සාමාන්‍ය තොරතුරු තාක්ෂණ

විභාගය මාර්ගගත ආකාරයට පැවැත්වීම සඳහා අවශ්‍ය යටිතල පහසුකම් පද්ධතියක් සකස් කර ඒ සඳහා සිසුන් පුහුණු කිරීම සඳහා පුහුණු පරීක්ෂණ සාර්ථකව පැවැත්වීමට හැකියාව ලැබුණි. මේ අනුව ඉදිරියේදී මාර්ගගත ක්‍රමයට පැවැත්විය හැකි විභාග සම්බන්ධයෙන් යොමු වීමට බලාපොරොත්තු වේ.

අ.පො.ස. (සා.පෙළ) විභාගයේ සෞන්දර්ය ප්‍රයෝගික පරීක්ෂණ ලිඛිත විභාගයෙන් පසු පැවැත්වීම දෙපාර්තමේන්තුවේ පැවති ක්‍රමවේදය විය. නමුත් ලිඛිත විභාගයෙන් පසු ප්‍රායෝගික පරීක්ෂණවලට ඉදිරිපත් වන ශිෂ්‍ය සංඛ්‍යාවේ විශාල අඩුවීමක් නිරීක්ෂණය වීම හේතුවෙන් 2018 වර්ෂයේදී ලිඛිත පරීක්ෂණයට පෙර ඔක්තෝබර් මාසයේදී සෞන්දර්ය විෂයයන්හි ප්‍රායෝගික පරීක්ෂණ පැවැත්වීමට පියවර ගන්නා ලදී. මේ හේතුවෙන් සිසුන්ගේ සහභාගිත්වය කැපී පෙනෙන වැඩි වීමක් දක්නට ලැබීම විශේෂත්වයකි.

විභාග අපේක්ෂකයන්ට යහපත් මානසික වාතාවරණයක් තුළ විභාගවලට පෙනී සිටීමට අවස්ථාව සැලසීම සඳහා පැය 03 ක රචනා වර්ගයේ ප්‍රශ්නපත්‍ර සඳහා ප්‍රශ්නපත්‍රය කියවීමට සහ ප්‍රශ්න තෝරා ගැනීම පිණිස විනාඩි 10 ක අමතර කියවීමේ කාලයක් ලබා දීම 2018 අ.පො.ස. (උ.පෙළ) විභාගයේ සිට ආරම්භ විය. මෙය සිසුන් විභාගවලට පෙනී සිටීමේදී අපේක්ෂකයන් තුළ ඇතිවන මානසික ආතතිය අඩු කර ගැනීමට මහඟු පිටිවහලක් විය.

විවිධ විභාග පැවැත්වීම සම්බන්ධයෙන් දීර්ඝ ඉතිහාසයකට හිමිකම් කියන ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුවේ ආරම්භක නියමුවා ලෙස කටයුතු කළ විභාග කොමසාරිස් එල්.එල්.කේ. ගුණතුංග මහතාගේ සිට මේ දක්වා විභාග කොමසාරිස්වරු 11 දෙනෙකු සහ විභාග කොමසාරිස් ජනරාල්වරු 08 දෙනකු මෙම දෙපාර්තමේන්තුවේ අභිවෘද්ධිය උදෙසා විශ්වසනීයතාවෙන් හා වලංගුතාවෙන් යුක්ත ඇගයීම් ක්‍රමවේද හඳුන්වා දෙමින් ඇගයීම් හා තක්සේරුකරණ ක්‍රියාවලිය ජාත්‍යන්තර මට්ටමට ගෙන ඒම සඳහා ඉමහත් කැපවීමකින් යුක්තව දායකත්වය ලබා දී ඇත.

විභාග දෙපාර්තමේන්තුව ආරම්භයේ සිට දැකිය හැකි වැදගත් ලක්ෂණයක් වන්නේ දෙපාර්තමේන්තුවට සුවිශේෂ වූ ආචාරධර්ම පද්ධතියක් ක්‍රියාත්මක වීම හා දුරදක්නා නුවණින් යුක්තව ස්ථාපිත කර ඇති පරිපාලනමය ව්‍යුහයයි. 1952 වර්ෂයේ සිටම පාලන වාර්තා අනුව පැහැදිලි වන්නේ ඔවුන් තුළ තිබූ අවංකභාවය, විශ්වාසවන්තභාවය, කැපවීම, කාර්යක්ෂම පරිපාලන හැකියාව, දූරදර්ශී බව, කාර්යශූරත්වය සහ ප්‍රතිපත්ති ගරුකභාවය මෙම දෙපාර්තමේන්තුව සඳහා වර්තමානයේ පවතින මහජන විශ්වාසය ගොඩනගා ගැනීමට ඉවහල් වූ බවය.

# විභාග දෙපාර්තමේන්තුවේ කාර්ය භාරය

1968 අංක 25 දරන ප්‍රසිද්ධ විභාග පනතින් ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව ප්‍රසිද්ධ විභාග පැවැත්වීම සම්බන්ධව නෛතික බලතල ඇති එකම ආයතනය බවට පත් විය. එදින සිට මේ දක්වා විභාග දෙපාර්තමේන්තුවේ කාර්යභාරය වඩාත් පුළුල් වී ඇත. මේ වන විට ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව මගින් වර්ෂයකට විභාග 300කට අධික ප්‍රමාණයක් සංවිධානය කර පවත්වනු ලබයි.

වර්තමානයේ ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව ඇගයීම් හා පරීක්ෂණ සේවාව වශයෙන්, පාසල් විභාග හා නියෝජිත ආයතන විභාග ලෙස අංශ දෙකකින් ක්‍රියාත්මක වේ.

දෙපාර්තමේන්තුවේ ප්‍රධාන මෙහෙවර වනුයේ විවිධ වර්ගවල විභාග සර්ව සාධාරණව පැවැත්වීමයි. දෙපාර්තමේන්තුව මගින් පවත්වනු ලබන විභාග පහත පරිදි වර්ග කළ හැකිය.

- ✶ පාසල් විභාග
- ✶ ආයතනික හා වෘත්තීය විභාග
- ✶ සහතික පත්‍ර විභාග
- ✶ උසස් කිරීමේ හා කාර්යක්ෂමතා කඩඉම් විභාග
- ✶ දේශීය / විදේශීය ආයතනික විභාග

පාසල් විභාග සඳහා පමණක් අයදුම්කරුවන් 1,526,156 ප්‍රමාණයක් 2018 වර්ෂයේදී සහභාගී වී ඇති අතර එම විභාග ඇගයීම් කටයුතු සඳහා සිංහල, දෙමළ, ඉංග්‍රීසි භාෂාත්‍රයෙන්ම පළමු, දෙවන, තෙවන හා නැවත සමීක්ෂණ කටයුතු සඳහා පරීක්ෂකවරු 51,584 දෙනෙකු සහභාගි වී ඇත.

2018 වර්ෂය තුළදී අනෙකුත් බඳවා ගැනීමේ විභාග, සහතික පත්‍ර විභාග, කාර්යක්ෂමතා කඩඉම් විභාග, උසස් කිරීමේ විභාග හා විදේශ විභාග සඳහා 445,913ක සංඛ්‍යාවක් අයදුම් කර ඇති අතර පාසල් විභාග සහ අනෙකුත් විභාග පරිපාලනය සඳහා 151,634ක් පමණ නිලධාරි සංඛ්‍යාවක් යොදවා ඇත.

දීප ව්‍යාප්තව සිටින ලක්ෂ සංඛ්‍යාත විභාග අපේක්ෂකයන් හට වඩාත් නිවැරදිව රහස්‍ය භාවයෙන් යුතුව සාධාරණ ලෙස විභාග පැවැත්වීම මෙම දෙපාර්තමේන්තුවේ ප්‍රධාන වගකීම වන අතර විභාග කාර්ය මණ්ඩල ලක්ෂ දෙකකට අධික ප්‍රමාණයක් මනා පුහුණුවක් සහිතව විභාග ක්‍රියාවලිය හා සම්බන්ධ වේ.

විභාග පරිපාලනය වඩාත් ඵලදායී හා කාර්යක්ෂම කිරීම උදෙසා විභාග කාර්ය මණ්ඩල සඳහා සුදුසුකම් ඇති පුද්ගලයන්ගේ සංචිතයක් පිහිටුවා ඔවුන්ට

විධිමත් පුහුණුවක් ලබා දීම සඳහා විශේෂ ව්‍යාපෘතියක් විභාග දෙපාර්තමේන්තුව මගින් ආරම්භ කර ඇත.

මේ වන විට දිස්ත්‍රික්ක කිහිපයකම පුහුණු කටයුතු අවසන් වී ඇති අතර ඉදිරි වසර කිහිපය තුළ විභාග පරිපාලනය සඳහා, පුහුණු සංචිතයෙන් නිලධාරීන් යොදා ගැනීමට අපේක්ෂිත ය.

නූතන තාක්ෂණික දියුණුවත් සමග විභාග අක්‍රමිකතා වැඩිවෙමින් පවතින අතර විභාග අපේක්ෂකයන් හා නිරීක්ෂකයන් අතින් සිදුවන සියලු අක්‍රමිකතා විමර්ශනය කොට වරදේ ස්වභාවය අනුව දඬුවම් කරනු ලැබේ. 2018 වර්ෂයේදී විමර්ශන කටයුතු විශාල ප්‍රමාණයක් සිදු කරන ලදි. වඩාත් සාධාරණ හා විශ්වසනීය විභාග වාතාවරණයක් ඇති කිරීම මෙමගින් බලාපොරොත්තු වේ.

දේශීය හා විදේශීය අවශ්‍යතා සඳහා විභාග සහතිකපත්‍ර නිකුත් කිරීම මෙම දෙපාර්තමේන්තුව මගින් සිදු කරනු ලබන ප්‍රධාන කාර්යයකි. එක්දින සේවා ක්‍රමයට සහ සාමාන්‍ය ක්‍රමය යටතේ සහතික පත්‍ර නිකුත් කරනු ලබන අතර සාමාන්‍යයෙන් දිනකට දහසකට අධික පිරිසක් මෙම සේවාව ලබා ගනිති.

සාමාන්‍ය ක්‍රමය යටතේ දින 04ක් වැනි කෙටිකාලයක් තුළ සහතික නිකුත් කිරීම සිදුවේ. මේ වන විට මාර්ගගත (Online) ක්‍රමය මගින් සහතික නිකුත් කිරීම ප්‍රවර්ධනය වී ඇත.

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව විභාග පැවැත්වීමට පමණක් සීමා නොවී පාසල් පද්ධතිය තුළ ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය සංවර්ධනය කිරීම සඳහා වැඩකටයුතු රාශියක් සිදු කරමින් සිටී. නව අධ්‍යාපන ප්‍රතිසංස්කරණ අනුව හෝ නව විෂයයන් හඳුන්වා දීමේදී හෝ විෂය නිර්දේශ සංශෝධනය අනුව හෝ ඊට අනුකූලව ප්‍රශ්න පත්‍ර ව්‍යුහය තීරණය කිරීම හා මූලාකෘති ප්‍රශ්න පත්‍ර සකස් කර, පාසල්වලට නිකුත් කිරීම සිදු කරනු ලබයි.

අ.පො.ස. (සාමාන්‍ය පෙළ), අ.පො.ස (උසස් පෙළ) හා 5 ශ්‍රේණිය ශිෂ්‍යත්ව විභාග වැනි ජාතික මට්ටමේ විභාගවල ප්‍රතිඵල සම්බන්ධයෙන් පළාත්, කලාප සහ පාසල් මට්ටමින් විශ්ලේෂණ වාර්තා සකස් කර ඒවා පාසල් පද්ධතිය වෙත බෙදා හැරීම මගින් සිසුන්ගේ ප්‍රබලතා හා දුර්වලතා හඳුනාගෙන ඒ අනුව සංවර්ධන වැඩසටහන් සැලසුම්කර ගැනීමට හැකියාව ලැබේ.

එමෙන්ම අ.පො.ස. (සාමාන්‍ය පෙළ), අ.පො.ස (උසස් පෙළ) විෂයයන් සඳහා ඇගයීම් වාර්තා සකස් කර පාසල්වලට ලබාදීම ද අප දෙපාර්තමේන්තුව සිදු කරනු ලබන වැදගත් කාර්යයකි.

සියලුම අභියෝගවලට සාර්ථකව මුහුණ දෙමින් ඉදිරියේදී ද විශ්වාසවන්තභාවය හා රහස්‍යතාව අතිශයින් සුරකිමින් ඉතා නිවැරදිව විභාග ක්‍රමවේදයන් නවීකරණය කරමින් විභාග පැවැත්වීම තුළින් සිසු දරුවන්ට, රාජ්‍ය සේවකයින්ට හා මහජනතාවට වඩාත් ඵලදායී සේවාවක් සැපයීම අපගේ ප්‍රධාන අරමුණයි.

2018 වර්ෂයේ දී ලක්ෂ 4කට අධික අයදුම්කරුවන් සංඛ්‍යාවක් සඳහා ආයතනික විභාග පැවැත්වීම සිදු කළ අතර ඒ සියලු විභාග කිසිදු ගැටළුවකින් තොරව පැවැත්වීමට හා අපේක්ෂක පැමිණිලි නොමැතිව විභාග ප්‍රතිඵල ලබා දීමට හැකිවීම නිසා වර්තමානය වන විට මහජන විශ්වාසය ඉතා හොඳින් ගොඩ නගා ගත් ආයතනයක් බවට ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව පත්ව ඇත.

දෙපාර්තමේන්තුවේ සියලුම ශාඛා ඒකාබද්ධව විශ්වස්‍යතාව සහ වලංගුතාව අතිශයින් ආරක්ෂා කර ගනිමින් සාධාරණ හා වලංගු ඇගයීම් හා තක්සේරුකරණ ක්‍රියාවලියක් ක්‍රියාත්මක කිරීමේ ජාතික මෙහෙවරක සාර්ථකව නිරත වී සිටී.

# 2.1 පාසල් විභාග සංවිධාන හා ප්‍රතිඵල ශාඛාව

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව ආරම්භයේ පටන්ම පවතින ශාඛාවක් වන පාසල් විභාග සංවිධාන හා ප්‍රතිඵල ශාඛාව මගින් පාසල් පද්ධතියට සම්බන්ධ වූ සියලුම ජාතික මට්ටමේ විභාග සහ ගුරු අධ්‍යාපනය සම්බන්ධයෙන් වූ විභාග සංවිධානය කර පැවැත්වීමත් ප්‍රතිඵල නිකුත් කිරීමත් සිදු කරනු ලබයි.

අ.පො.ස. (උසස් පෙළ), අ.පො.ස. (සාමාන්‍ය පෙළ), 5 ශ්‍රේණිය ශිෂ්‍යත්ව සහ සාමාන්‍ය තොරතුරු තාක්ෂණ විභාගය මෙම ශාඛාව මගින් සංවිධානය කරනු ලබන ප්‍රධාන පාසල් විභාග වේ.

මීට අමතරව ජාතික ශික්ෂණ විද්‍යා ඩිප්ලෝමා අවසාන පරීක්ෂණය, ගුරු විද්‍යාල අවසාන විභාගය, උපාධිධාරී නොවන නුපුහුණු ගුරුවරුන් සඳහා පුහුණු පාඨමාලා විභාගය ආදී විභාග අයදුම්පත් භාර ගැනීමේ සිට විභාග පවත්වා ප්‍රතිඵල ලබා දීම දක්වා වූ ප්‍රධාන කාර්යභාරය මෙම ශාඛාවෙන් ඉටු කරනු ලබයි.

ඉංජිනේරු තාක්ෂණවේදය හා ජෛව පද්ධති තාක්ෂණවේදය විෂය සඳහා පිළිවෙලින් අයදුම්කරුවන් 8459ක් හා 5042ක් වෙනුවෙන් 2015 වර්ෂයේ ආරම්භ කළ ප්‍රායෝගික පරීක්ෂණ, 2018 වර්ෂයේ පිළිවෙලින් අයදුම්කරුවන් 17 892ක් හා 11 546ක් දක්වා වර්ධනයක් පෙන්නුම් කර ඇති අතර ඒ සඳහා විධිමත් ලෙස ප්‍රායෝගික පරීක්ෂණ පැවැත්වීමට හැකි වී ඇත.

සාමාන්‍ය තොරතුරු තාක්ෂණය (GIT) විභාගය 2018 ශ්‍රී ලංකාවේ ප්‍රථම වතාවට මාර්ගගත (Online) ක්‍රමයට පවත්වනු ලැබිණ. මෙම විභාගයට අදාළව පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂවරු හා පරිගණක තාක්ෂණ කමිටු මගින් නිලධාරීන් පුහුණු කිරීම සහ මාර්ගගත (Online) ක්‍රමයට විභාග පැවැත්වීමට යෝග්‍ය කලාපීය පරිගණක සම්පත් මධ්‍යස්ථාන හා පාසල් පරිගණක විද්‍යාගාර ඵලදායී ලෙස යොදා ගැනීමට හැකි විය.

ආසියාතික ක්‍රීඩා තරඟයට සහභාගී වූ අයදුම්කරුවෙකු වෙනුවෙන් ඉන්දුනීසියාවේ ජකර්තා නුවරදී විභාග මධ්‍යස්ථානයක් ස්ථාපිත කොට, 2018 අ.පො.ස. (උ.පෙළ) විභාගය ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුවේ නිලධාරීන්ගේ සහභාගීත්වයෙන් සාර්ථකව පැවැත්වීමට හැකි විය. ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව අවස්ථානුකූලව ශ්‍රී ලංකාව තුළදී පමණක් නොව විදේශයකදී වුව ද විභාගයක් සංවිධානය කොට පැවැත්වීමේ ශක්‍යතාවක් ලබා ඇති බව මෙයින් ගම්‍ය වේ.

පාසල් විභාග සඳහා වෙන් වූ මෙම ශාඛාවේ වාර්ෂික වැඩ සැලැස්මට අනුව 2018.01.01 සිට 2018.12.31 දක්වා සංවිධානය කොට පවත්වන ලද පාසල් විභාග හා පාසල් පද්ධතියේ වෙනත් විභාග පිළිබඳ දත්ත පහත පරිදි වේ.

| විභාගය | මධ්‍යස්ථාන සංඛ්‍යාව | අපේක්ෂක සංඛ්‍යාව | විභාග පැවති කාල සීමාව | ප්‍රතිඵල නිකුත් කළ දිනය | විභාග පරිපාලන කාර්ය සඳහා සහභාගී වූ සංඛ්‍යාව |
|---|---|---|---|---|---|
| අ.පො.ස (උ.පෙළ) විභාගය 2018 | 2268 | 321469 | 2018.08.06 2018.09.01 | 2018.12.29 | 24260 |
| අ.පො.ස.(සා.පෙළ) විභාගය 2018 | 4664 | 656641 | 2018.12.03 2018.12.12 | 2019.03.28 | 49321 |
| සාමාන්‍ය තොරතුරු තාක්ෂණ විභාගය 2018 | 656 | 186262 | 2019.10.14 2019.10.21 | - | - |
| 5 ශ්‍රේණිය ශිෂ්‍යත්ව විභාගය 2018 | 3050 | 355326 | 2018.08.05 | 2018.10.05 | 28950 |
| ගුරු විද්‍යාල අවසාන විභාගය 2018 | 19 | 2135 | 2018.06.18 2018.07.01 | 2019.02.01 | 320 |
| ජාතික ශික්ෂණ විද්‍යා ඩිප්ලෝමා පුනර් බාහිර අවසාන පරීක්ෂණය 2018 | 35 | 4489 | 2018.03.05 2018.03.16 | 2019.01.30 | 361 |

## 2.2 රහස්‍ය (පාසල් විභාග) ශාඛාව

පාසල් විභාග සංවිධාන හා ප්‍රතිඵල ශාඛාව සමග මනා සබඳතාවක් පවත්වාගෙන යමින් එම ශාඛාව මගින් සංවිධානය කරනු ලබන සියලුම විභාගවලට අදාළ ප්‍රශ්න පත්‍ර සකස් කිරීම හා එම ප්‍රශ්න පත්‍ර සම්බන්ධීකරණ මධ්‍යස්ථාන වෙත නිකුත් කිරීම දක්වා වූ සියලු කටයුතු මෙම ශාඛාව මගින් සිදු කරනු ලැබේ.

එක් එක් විභාගයේ විෂයයන් සඳහා සුදුසුකම් ලත් පරීක්ෂකවරුන් තෝරා ගැනීමත් විශ්වසනීයතාව සහ වලංගුතාව උපරිම වශයෙන් ආරක්ෂා වන පරිදි ඉහළ ගුණාත්මක බවකින් යුත් ප්‍රශ්න පත්‍ර නිර්මාණය කිරීමත් මෙම ශාඛාවේ ප්‍රධාන කාර්යය වේ. මෙහිදී මාධ්‍ය අනුව ප්‍රශ්න පත්‍ර පරිවර්තනය කිරීම, ප්‍රමිත කිරීම හා ඒවා මනා ලෙස සම්බන්ධීකරණය කිරීම සිදු කෙරේ. රහස්‍යභාවය පූර්ණ වශයෙන් රැක ගනිමින් ප්‍රශ්න පත්‍ර මුද්‍රණය කිරීම රහස්‍ය මුද්‍රණාලය තුළ හා ඇසුරුම් කාමරයේ ස්ථාපිත කර ඇති ඩිජිටල් ඒකකය තුළ සිදු කෙරේ. මුද්‍රණ කාර්යය හා ඊට අදාළ කටයුතු අධීක්ෂණය සඳහාත් ප්‍රශ්න පත්‍ර ඇසුරුම්කරණය සඳහාත් විභාග කොමසාරිස් ජනරාල් විසින් අනුමත කළ විශේෂ කණ්ඩායමක් යොදා ගැනේ. ප්‍රශ්න පත්‍ර සකස් කිරීමේ කාර්යයේ සිට ඇසුරුම් කළ ප්‍රශ්න පත්‍ර සම්බන්ධීකරණ

මධ්‍යස්ථානවලට බෙදා හැරීම දක්වා වූ සංකීර්ණ ක්‍රියාවලිය මෙම ශාඛාව මගින් මෙහෙයවනු ලැබේ.

2018 වසරට අදාළව රහස්‍ය ශාඛාවේ ඩිජිටල් ඒකකය තුළ මුද්‍රණය කරන ලද ප්‍රශ්න පත්‍ර සහ අනෙකුත් ලේඛන පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| අනු අංකය | මුද්‍රණය කරන ලද ලේඛන | මුද්‍රණය කරන ලද ප්‍රමාණය |
|---|---|---|
| 01 | අ.පො.ස.(සාමාන්‍ය පෙළ) විභාගය ප්‍රයෝගික පරික්ෂණය 2017 | 130 000 |
| 02 | ජාතික ශික්ෂණ විද්‍යා ඩිප්ලෝමා අවසාන විභාගය | 40 000 |
| 03 | අ.පො.ස.(උසස්.පෙළ) විභාගය 2018 | 460 000 |
| 04 | ගුරු විද්‍යාල අවසාන විභාගය 2018 | 15 000 |
| 05 | අ.පො.ස.(උසස්.පෙළ) ප්‍රායෝගික පරීක්ෂණය 2018 | 325 000 |
| 06 | අ.පො.ස.(සාමාන්‍ය පෙළ) විභාගය 2018 | 663 000 |
| 07 | අ.පො.ස.(සාමාන්‍ය පෙළ) ප්‍රායෝගික පරීක්ෂණය 2018 | 160 000 |
| 08 | රහස්‍ය (පා.වි.) ශාඛාවේ වෙනත් ලේඛන | 40 000 |
| 09 | රහස්‍ය (ආයතනික විභාග) ශාඛාවේ ප්‍රශ්න පත්‍ර | 60 000 |
| 10 | ප්‍රතිඵල (ආයතනික විභාග) ශාඛාවේ ලේඛන | 2 000 |
| 11 | අධ්‍යාපන අමාත්‍යාංශයේ ලේඛන | 18 000 |

## 2.3 ඇගයීම් (පාසල් විභාග) ශාඛාව

අ.පො.ස. (සා.පෙළ), අ.පො.ස. (උ.පෙළ), සාමාන්‍ය තොරතුරු තාක්ෂණ විභාගය, 5 ශ්‍රේණිය ශිෂ්‍යත්ව විභාගය ඇතුළු පාසල් විභාග සඳහා වාර්ෂිකව ලක්ෂ දහයකට ආසන්න අපේක්ෂක සංඛ්‍යාවක් පෙනී සිටිති. ඊට අමතරව ජාතික ශික්ෂණ විද්‍යා ඩිප්ලෝමා අවසාන විභාගය, ගුරු විද්‍යාල අවසාන විභාගය, සීතාවකපුර පිරිවෙන් ගුරු අවසාන විභාගය සහ පශ්චාත් උපාධි අධ්‍යාපන ඩිප්ලෝමා පාඨමාලාවට බඳවා ගැනීමේ විභාගය යන විභාගවල ද ඇගයීම් කටයුතු සිදු කරනු ලැබේ. මෙම ශාඛාවේ ප්‍රධාන කාර්යභාරය වන්නේ එම විභාගවල උත්තරපත්‍ර නිවැරදිවත් කාර්යක්ෂමවත් ඇගයීමට ලක් කිරීමයි.

උත්තරපත්‍ර පරීක්ෂකවරුන් සම්බන්ධ කරගනිමින් ඉලක්කගත දිනයකට ප්‍රතිඵල ලබාදීම සඳහා දැවැන්ත මෙහෙයුමක් මෙම ශාඛාව මගින් සිදු කරනු ලැබේ. රටේ අනාගත අභිවෘද්ධියට බුද්ධිමතුන් තෝරා දීමේ ප්‍රධාන කාර්යයෙහි නියැලී සිටින ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව තුළ විශ්වසනීයත්වය සුරක්ෂිත කරනු ලබන විශේෂිත ශාඛාවක් ලෙස මෙම ශාඛාව හැඳින්විය හැකිය.

අ.පො.ස. (සා.පෙළ) විභාගයේ උත්තර පත්‍ර ඇගයීම අදියර 2ක් යටතේ ද, අ.පො.ස. (උ.පෙළ) විභාගයේ පිළිතුරු පත්‍ර ඇගයීම අදියර 3ක් යටතේ ද නියමිත කාල රාමුවක් තුළ මේ කටයුතු සිදුවේ. ඇගයීම් කටයුතු සිදුකිරීමේ දී එක් එක් ප්‍රශ්න පත්‍රය සඳහා භාෂා මාධ්‍යය අනුව ලකුණු දීමේ පටිපාටිය බැගින් සකස් කිරීම, පාලක උත්තරපත්‍ර ලකුණු කිරීම හා අනුහුරු අභ්‍යාස කිරීම මගින් ඇගයීම් ක්‍රියාවලියේ වලංගුතාව සහ සංගතතාව ආරක්ෂා කිරීමට විශාල පරිශ්‍රමයක් දරනු ලැබේ. විභාග ප්‍රතිඵල නිකුත් කිරීමෙන් පසු තම ප්‍රතිඵල සම්බන්ධයෙන් සෑහීමකට පත් නොවන අයදුම්කරුවන්ගෙන් ලැබෙන අයදුම්පත්‍ර අනුව නැවත සමීක්ෂණ කටයුතු සිදු කෙරේ. මේ සඳහා ද අයදුම්කරුවන් විශාල සංඛ්‍යාවක් අයදුම්පත්‍ර ඉදිරිපත් කරන අතර උත්තරපත්‍ර පරීක්ෂා කිරීමේ ප්‍රධාන පරීක්ෂකවරුන් සම්බන්ධ කර ගනිමින් මුල් වරට උත්තරපත්‍ර ලකුණු කිරීමේදී දෝෂ සිදු වී තිබේ ද යන්න පිළිබඳව මෙහිදී පරීක්ෂා කරනු ලබයි.

සිංහල, දෙමළ සහ ඉංග්‍රීසි යන භාෂා ත්‍රිත්වයෙන්ම ඇගයීම් කටයුතු සිදු කරන අතර, විශ්වසනීයතාව හා සංගතතාව ආරක්ෂා කර ගනිමින් ඉහළ ගුණාත්මක භාවයකින් යුතු තක්සේරුකරණ ක්‍රියාවලියක් සිදු කිරීම මෙම ශාඛාවේ ප්‍රධානතම වගකීම වේ.

**2018 වර්ෂයේ දී සිදු කරන ලද ඇගයීම් කටයුතු පිළිබඳව විස්තර පහත දක්වේ.**

| විභාගය | ඇගයීම් මණ්ඩල ගණන | | | ඇගයීම් කටයුතු සිදු කළ කාලය | ඇගයීම සඳහා සහභාගී වූ පරීක්ෂකවරු සංඛ්‍යාව |
|---|---|---|---|---|---|
| | සිංහල | දෙමළ | ඉංග්‍රීසි | | |
| අ.පො.ස.(සා.පෙළ) විභාගය 2018 | 1,200 | 511 | 328 | 2018.12.23 - 2019.01.01<br>2019.01.08 - 2019.01.17 | 24,756 |
| අ.පො.ස.(උ.පෙළ) විභාගය 2018 | 695 | 178 | 163 | 2018.08.23 - 2018.09.05<br>2018.09.11 - 2018.09.24<br>2018.09.18 - 2018.09.29 | 14,504 |
| 5 ශ්‍රේණිය ශිෂ්‍යත්ව විභාගය 2018 | 322 | 98 | | 2018.08.15 - 2018.08.21 | 5,775 |
| සාමාන්‍ය තොරතුරු තාක්ෂණ විභාගය 2018 | 60 | 16 | 07 | 2018.03.07 - 2018.03.18 | 1,400 |
| ජාතික ශික්ෂණ විද්‍යා ඩිප්ලෝමා අවසාන විභාගය 2017 (2018) | 30 | 25 | 20 | 2018.04.21 - 2018.06.20 | 525<br>1,000 |
| ගුරු විද්‍යාල අවසාන විභාගය 2018 | 19 | 15 | 21 | 2018.07.17 - 2018.07.24<br>කේවල<br>2018.07.06 - 2018.08.30 | 300 |

| නැවත සමීක්ෂණ | අයදුම්කරුවන් සංඛ්‍යාව | ඇගයීම් කටයුතු සිදු කළ කාලය | ඇගයීම් සඳහා සහභාගී වූ පරීක්ෂකවරු සංඛ්‍යාව |
|---|---|---|---|
| අ.පො.ස.(සා.පෙළ) විභාගය 2017 | 91,062 | 2018.05.30<br>2018.06.22 | 1,194 |
| අ.පො.ස.(උ.පෙළ) විභාගය 2017 | 67,836 | 2019.02.11<br>2019.03.03 | 750 |
| 5 ශ්‍රේණිය ශිෂ්‍යත්ව විභාගය 2018 අභියාචනා පරීක්ෂා කිරීම | 20,744 | 2018.11.19 දින සිට<br>2019.11.25 දින දක්වා | 380 |

## 2.4 විමර්ශන ශාඛාව

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව මගින් පවත්වනු ලබන සියලුම විභාගවල විභාග නීතිරීති උල්ලංඝනය වන පරිදි අපේක්ෂකයන් වංචනික ක්‍රියාවල නිරතවීම හා ඔවුන් විසින් සිදුකරනු ලබන අක්‍රමිකතා විමර්ශනය කිරීම මෙම ශාඛාව මගින් සිදුකෙරේ. එමෙන්ම විභාග රාජකාරි සඳහා යොදවා ඇති නිලධාරීන් විසින් සිදු කරනු ලබන වංචනික ක්‍රියා සහ අක්‍රමිකතා විමර්ශනයට ලක් කිරීම හා ඒවාට අදාළ නීතිමය පියවර ගැනීම සඳහා කටයුතු කිරීම ද මෙම ශාඛාවේ කාර්යභාරයකි. තාක්ෂණයේ දියුණුවත් සමග විභාග වංචා දිනෙන් දින වැඩි වී ඇති අතර ඒ සියලු කාරණා පිළිබඳ දැඩි අවධානයක් යොමු කරමින් නීතිගරුක විභාග පරිසරයක් විභාග මධ්‍යස්ථානවල ස්ථාපිත කිරීම මෙම ශාඛාව මගින් අපේක්ෂිත ප්‍රධාන කාර්යභාරය වේ. විමර්ශන ක්‍රියාවලියෙන් පසු අපේක්ෂකයින් සිදු කරනු ලබන වරදේ ස්වභාවය අනුව අධිකරණ ක්‍රියාමාර්ග ගැනීම ඇතුළුව විවිධ දඬුවම් පැමිණවීමත්, රාජකාරියේ නියුතු නිලධාරීන් විසින් සිදු කරනු ලබන අක්‍රමිකතා සඳහා විභාග රාජකාරි තහනම් කිරීම හා විනය ක්‍රියාමාර්ග ගැනීමත් මගින් විභාග අක්‍රමිකතා වැළැක්වීමට කටයුතු කරනු ලැබේ.

ඔම්බුඩ්ස්මන් විසින් හා ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව විසින් විමර්ශන කෙරෙන විෂයයන් සඳහා ගොනු විවෘත කිරීම, අදාළ ශාඛා හා සම්බන්ධ වී පිළිතුරු වාර්තා සකස් කිරීම, අවශ්‍ය පරිදි නීතිපති මගින් ලිඛිත හෝ වාචික උපදෙස් ලබා ගැනීම හා අධිකරණයෙන් කරනු ලබන දැනුම් දීම මත අදාළ දිනවල දී නිලධාරීන් අධිකරණයේ පෙනී සිටීම යනාදී සියලු නෛතික කටයුතු ද සම්බන්ධීකරණය කරනු ලබන්නේ මෙම ශාඛාව මගිනි.

### 2018 වර්ෂයේ පවත්වන ලද විමර්ශන පිළිබඳ විස්තර

| විභාගය | වාර්තා වූ වංචනික සිදුවීම් සංඛ්‍යාව | ප්‍රතිඵල අත්හිටුවීම හෝ වෙනත් දඬුවම් දීම සංඛ්‍යාව | ප්‍රතිඵල නිදහස් කළ සංඛ්‍යාව | විමර්ශන තවදුරටත් පැවැත්වෙන හෝ අධිකරණ කටයුතු හේතුවෙන් විමර්ශන අවසන් නොවූ සංඛ්‍යාව |
|---|---|---|---|---|
| 5 ශ්‍රේණිය ශිෂ්‍යත්ව විභාගය 2018 | | | | |
| අ.පො.ස. (සා.පෙළ) විභාගය 2017 | 2,798 | 956 | 1,842 | |
| අ.පො.ස. (උ.පෙළ) විභාගය 2018 | 255 | 119 | 136 | |
| ආයතනික විභාග (වර්ෂය මුළුල්ලේ පවත්වන ආයතනික විභාග අංශයට අයත් විභාග) | 1,268 | 175 | 836 | 257 |

| | |
|---|---|
| 2018 වර්ෂයේදී නඩු / මානව හිමිකම් සභාව, ඔම්බුඩ්ස්මන් හා අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාවට ඉදිරිපත් වී ඇති පැමිණිලි සඳහා පිළිතුරු සැපයීම | 13 |
| විභාග මධ්‍යස්ථානවලදී හා ඇගයීම් මධ්‍යස්ථානවලදී නිලධාරීන් විසින් කරන ලද විවිධ වැරදි හා අක්‍රමිකතා හේතුවෙන් විභාග රාජකාරි තහනම් කරන ලද නිලධාරීන් සංඛ්‍යාව | 122 |
| විභාග මධ්‍යස්ථානවලදී සිදු කරන ලද වැරදි සම්බන්ධව ආයතනික අංශයේ විභාග ප්‍රතිඵල අත්හිටුවන ලද හා අවලංගු කරන ලද අපේක්ෂකයන්ගේ සංඛ්‍යාව | 175 |

## 2.5 සහතික පත්‍ර ශාඛාව

මහජනතාව සමග ඉතා සමීප සම්බන්ධතාවක් පවත්වා ගනිමින් දෛනිකව විශාල සේවාවක් සපයන ශාඛාවකි. මෙම ශාඛාව මගින් දේශීය හා විදේශීය භාවිතය සඳහා සහතිකපත් නිකුත් කිරීම, රාජ්‍ය හා පෞද්ගලික ආයතන සඳහා විභාග ප්‍රතිඵල සනාථ කිරීම ආදී කාර්යයන් රාශියක් සිදු කරනු ලබයි. අ.පො.ස. (සාමාන්‍ය පෙළ) හා අ.පො.ස. (උසස් පෙළ) විභාග සඳහා සහතිකපත්‍ර, ජාතික හා ජාත්‍යන්තර වශයෙන් භාවිත කළ හැකි පරිදි විදේශ කටයුතු අමාත්‍යාංශය සමග එකතු වී සහතිකපත්‍ර නිකුත් කරනු ලබයි. දෛනිකව පුද්ගලයන් දහසකට ආසන්න සංඛ්‍යාවක් මෙම සේවාව ලබා ගැනීම සඳහා මෙම ආයතනයට පැමිණෙන අතර එක් දින සේවාව යටතේ සහ සාමාන්‍ය සේවාව යටතේ මෙම සහතික පත්‍ර නිකුත් කරනු ලබයි. මෙහිදී නොයෙකුත් ගැටලු සහිතව පැමිණෙන පිරිස වෙනුවෙන් කාර්යක්ෂම සේවාවක් ඉටු කර දීම මෙම ශාඛාවේ ප්‍රධාන අරමුණ වෙයි. එමෙන්ම විභාග ප්‍රතිඵල සනාථ කිරීමේදී රජයේ අමාත්‍යාංශ, දෙපාර්තමේන්තු, පළාත් සභා,

පළාත් පාලන ආයතන ඇතුළු රාජ්‍ය ආයතනවලින් මෙම ශාඛාව වෙත ලැබෙන විභාග ප්‍රතිඵල සනාථ කිරීම් දහස් ගණනක් සඳහා කාර්යක්ෂම සේවාවක් ඉටු කරනු ලැබේ. රාජ්‍ය ආයතන පමණක් නොව බැංකු, සංස්ථා, මණ්ඩල, අධිකාරි මෙන්ම පෞද්ගලික ආයතනවල ප්‍රතිඵල සනාථ කිරීම සිදු කිරීම ආරම්භ කර ඇති අතර එම ආයතනවලින් ප්‍රතිඵල සනාථ කර ගැනීම සඳහා කරනු ලබන ඉල්ලීම් සීඝ්‍ර ලෙස වර්ධනය වී තිබේ.

මීට අමතරව 2018 අප්‍රේල් මස සිට මාර්ගගත ක්‍රමය (online) ඔස්සේ ප්‍රතිඵල සනාථ කර ගැනීමේ පහසුකම් දිවයින පුරා පිහිටි කලාප අධ්‍යාපන කාර්යාල හා අධ්‍යාපන අමාත්‍යාංශය වෙත ලබාදී ඇත.

**2018 වර්ෂයේ දී නිකුත් කරන ලද සහතික පත්‍ර පිළිබඳ විස්තර**

| වැඩ විස්තරය | ඒකකයක වටිනාකම රුපියල් | ඒකක ප්‍රමාණය | ආදායම රුපියල් |
|---|---|---|---|
| **එක්දින සේවය මගින් විදේශීය හා දේශීය සහතික නිකුත් කිරීම**<br>I අ.පො.ස. (සාමාන්‍ය පෙළ) විභාගය, අ.පො.ස. (උසස් පෙළ), බෞද්ධ ධර්මාචාර්ය, මූලික පිරිවෙන්, අල්අලීම්, ඉස්ලාම් දීනියාත්, හින්දු ධර්මාචාර්ය, ජාතික නැටුම්/සංගීත විභාගය, බටහිර සංගීත (න්‍යාය/ප්‍රායෝගික) විභාගය, කාර්මික විද්‍යාල විභාග, සාමාන්‍ය තොරතුරු තාක්ෂණ විභාගය, ගුරු විද්‍යාල, කතෝලික ධර්මාචාර්ය යන විභාගවල සහතික නිකුත් කිරීම | 600.00 | 131,432 | 78,859,200.00 |
| II එක් දින සේවය මගින් ඉහත සඳහන් සහතිකවල අතිරේක සහතිකපත් නිකුත් කිරීම | 300.00 | 22,080 | 6,624,000.00 |
| **එක් දින සේවය මගින් විභාග අංක සෙවීම**<br>අ.පො.ස. (සාමාන්‍ය පෙළ), අ.පො.ස. (උසස් පෙළ) පමණි. | 150.00 | 4,379 | 656,850.00 |
| **සාමාන්‍ය සේවය යටතේ විදේශීය හා දේශීය සහතික නිකුත් කිරීම**<br>I අ.පො.ස. (සාමාන්‍ය පෙළ) විභාගය, අ.පො.ස. (උසස් පෙළ) විභාගය | 350.00 | 5,665 | 1,982,750.00 |
| II සාමාන්‍ය සේවය මගින් ඉහත සඳහන් සහතිකවල අතිරේක සහතිකපත් නිකුත් කිරීම | 200.00 | 603 | 120,600.00 |

| | | | |
|---|---|---|---|
| එක්දින සේවා සහතික විදේශීය විශ්වවිද්‍යාල අවශ්‍යතා සඳහා තැපැල් කිරීම.<br>• තවද එක්දින සේවාව මගින් සහතික පත්‍ර ලබා ගැනීම සඳහා ඉල්ලුම් කරන ලදුව අයදුම්කරුවන් විසින් courier සේවාව වෙත කාඩ්පත යොමු කිරීමෙන් පසු, එම සේවාව වෙත සහතිකපත්‍ර භාරදීමේ පහසුකම් ද සලසා ඇත. | 300.00 | 847 | 254,100 |
| **දේශීය අවශ්‍යතා සඳහා බාහිර අයදුම්කරුවන්ට පමණක් විභාග ප්‍රතිඵල දෙවන පිටපත් නිකුත් කිරීම**<br><br>අ.පො.ස. (සාමාන්‍ය පෙළ) විභාගය, අ.පො.ස. (උසස් පෙළ) විභාගය | | | |
| **අන්තර්ජාලය මගින් විභාග සහතික ඉල්ලුම් කිරීම විදේශීය හා දේශීය භාවිත සඳහා** | | | |
| **සියලු රාජ්‍ය සේවකයන්ගේ නිලධාරීන් හා කාර්ය මණ්ඩලවල විභාග ප්‍රතිඵල සනාථ කිරීම**<br>සියලු ම රජයේ අමාත්‍යාංශ, දෙපාර්තමේන්තු, රාජ්‍ය පරිපාලන, පළාත් සභා, පළාත් පාලන ආයතන, ප්‍රාදේශීය ලේකම් කාර්යාල, ත්‍රිවිධ හමුදා යන සියලු ම රාජ්‍ය ආයතන | මුදල් අය කිරීමක් සිදු නො කෙරේ | 102,940 | |
| **අර්ධ රාජ්‍ය ආයතන සඳහා ප්‍රතිඵල සනාථ කිරීම**<br>1. බැංකු, සංස්ථා, මණ්ඩල, අධිකාරි, ගුවන් හා නාවික, අර්ධ රාජ්‍ය ආයතන<br>2. අස්ථානගත සනාථ ලිපි වෙනුවෙන් දෙවන වරට සනාථ ලිපි නිකුත් කිරීම සඳහා දඩ මුදල් අයකර ගැනීම<br>3. විදේශීය තානාපති කාර්යාල / දූත මණ්ඩල | 700.00<br><br>200.00 | 32,828 | 22,979,600.00 |
| ගුරු පුහුණු සහතික නිකුත් කිරීම (සිංහල, ඉංග්‍රීසි හා දෙමළ) | මුදල් අය කිරීමක් සිදු නො කෙරේ | 70 | |
| උපාධිධාරී නොවන නුපුහුණු ගුරු සිසුන් සඳහා දෙවන පිටපත් නිකුත් කිරීම (සිංහල හා දෙමළ) | | | |
| 'ප්‍රින්සෙට්' සහතික නිකුත් කිරීම | | | |

| | | | |
|---|---|---|---|
| කාර්මික විද්‍යාල සහතිකපත් නිකුත් කිරීම | | | |
| ජාතික නැටුම්/සංගීත සහතිකපත් නිකුත් කිරීම | | | |
| මූලික පිරිවෙන් සහතික නිකුත් කිරීම | | | |
| බෞද්ධ ධර්මාචාර්ය විභාග සහතිකපත් නිකුත් කිරීම | | 1,000 | |
| භාෂා මාධ්‍ය තහවුරු කිරීමේ ලිපි නිකුත් කිරීම | | | |

**ඉහත සේවාවලට අතිරේකව සහතික පත්‍ර ශාඛාව මගින් ඉටුකිරීමට අපේක්ෂිත ව්‍යාපෘති**

01 පැරණි ප්‍රතිඵල ලේඛන (1991 ට පෙර) OCR ක්‍රමයට Scan කර, එම විද්‍යුත් ලිපි ගොනු ආශ්‍රයෙන් සහතිකපත්‍ර මුද්‍රණය සඳහා තොරතුරු ලබාගත හැකි පරිගණක දත්ත පද්ධතියක් (Retrievable Computer Data System) නිර්මාණය කර ගැනීමේ ව්‍යාපෘතිය.

02. ඉහත කාර්යයේ Scan කිරීම සඳහා පිටු වෙන් කරනු ලබන පොත්, නැවත විධිමත් පරිදි පොත් වශයෙන් බැඳීම් කර, යථාවත් කරනු ලබන ලේඛනාගාරයක (අලුතින් තැනූ රාක්ක සමග) ක්‍රමානුකූලව තැන්පත් කිරීමේ ව්‍යාපෘතිය.

03. සහතිකපත් ලබාගැනීමේ එක්දින සේවාව පිළිබඳ රාජ්‍ය තොරතුරු කේන්ද්‍රය (1919) හරහා ද විමසීම් කරනු ලබන බැවින්, එවැනි අවස්ථාවලදී නිවැරදි තොරතුරු සැපයීම සඳහා විධිමත් ක්‍රමවේදයක් සකස් කිරීමේ ව්‍යාපෘතිය.

04. මාර්ගගත (Online) ක්‍රමවේදය යටතේ සහතික ලබා ගැනීමට අයදුම් කිරීමේ වැඩසටහන.

05. ශාඛාව තුළ නවීන තාක්ෂණය භාවිත කරමින් ප්‍රතිඵල සනාථ කිරීමේ කටයුතු කාර්යක්ෂමව ඉටු කිරීම සඳහා විධිමත් ක්‍රමවේදයක් සකස් කිරීමේ ව්‍යාපෘතිය.

# 2.6 පර්යේෂණ හා සංවර්ධන ශාඛාව

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව මගින් පවත්වන පාසල් විභාග හා සම්බන්ධ සියලු ම විභාග ප්‍රශ්න පත්‍රවල ගුණාත්මකභාවය වර්ධනය කිරීම සඳහා අවශ්‍ය දත්ත එක්රැස් කිරීම, ප්‍රශ්න පත්‍ර හා ප්‍රතිඵල විශ්ලේෂණය කිරීම හා ප්‍රශ්න පත්‍ර සකස් කිරීමේ හා පිළිතුරු පත්‍ර ඇගයීමේ කාර්යයන්හි යෙදෙන පරීක්ෂකවරුන් ඒ පිළිබඳව දැනුවත් කිරීම මෙම ශාඛාවේ ප්‍රධාන කාර්යයකි. එමෙන් ම නව අධ්‍යාපන ප්‍රතිසංස්කරණ සිදු කරන අවස්ථාවලදී, නව විෂයයන් හඳුන්වා දෙන අවස්ථාවල දී සහ විෂය නිර්දේශ සංශෝධනය සිදු කෙරෙන අවස්ථාවලදී ඊට අනුකූලව ප්‍රශ්න පත්‍ර ව්‍යුහය තීරණය කිරීම හා මූලාකෘති ප්‍රශ්න පත්‍ර සකස් කර, පාසල්වලට යැවීම ද මෙම ශාඛාවේ ප්‍රධාන වගකීමකි.

තව ද ප්‍රශ්න පත්‍ර විශ්ලේෂණය තුළින් ලබා ගන්නා තොරතුරු ඇසුරින් අයදුම්කරුවන් පහළ සාධන මට්ටමක් දක්වන විෂය ක්ෂේත්‍ර හඳුනාගෙන ඒ පිළිබඳව ප්‍රතිපත්ති සම්පාදකයන්, පළාත්, කලාප සහ විෂය භාර අධ්‍යාපන අධ්‍යක්ෂවරුන්, ගුරුභවතුන් ඇතුළු අදාළ සියලුම පාර්ශ්වයන් දැනුවත් කිරීම තුළින් අධ්‍යාපනයේ ගුණාත්මක සංවර්ධනය සඳහා දායකත්වය ලබා දීම මෙම ශාඛාව මගින් කරනු ලබන වැදගත් කාර්යයකි.

ඒ අනුව පර්යේෂණ හා සංවර්ධන ශාඛාවේ 2018 වර්ෂයට අදාළ කාර්ය සාධනය පිළිබඳ විස්තර පහත දැක්වේ.

1. 2017 වර්ෂයේදී හඳුන්වා දුන් අ.පො.ස. (උ.පෙළ) නව විෂය නිර්දේශවලට අනුව අ.පො.ස. (උ.පෙළ) විභාගය 2019 සහ ඉන් ඉදිරියට පැවැත්වෙන විභාග සඳහා ප්‍රශ්න පත්‍ර ව්‍යුහය සහ මූලාකෘති ප්‍රශ්න ඇතුළත් පොත් සකස් කර, දෙපාර්තමේන්තු වෙබ් අඩවියේ පළ කර ඇති අතර, මුද්‍රණය සඳහා සූදානම් කර ඇත.

2. 2017 වසරේ දී මූලික පිරිවෙන් අවසාන විභාගය සඳහා හඳුන්වා දුන් නිපුණතා පාදක නව විෂය නිර්දේශවලට අනුකූල වන පරිදි එම විභාගයට අදාළ විෂයයන් හි ප්‍රශ්නපත්‍ර ව්‍යුහ සංශෝධනය කරන ලදි. එම සංශෝධිත ව්‍යුහවලට අනුව, මූලික පිරිවෙන් අවසාන විභාගය 2018 සහ ඉන් ඉදිරියට පැවැත්වෙන විභාග සඳහා ප්‍රශ්න පත්‍ර ව්‍යුහය සහ මූලාකෘති ප්‍රශ්න ඇතුළත් පොත් සකස් කර, දෙපාර්තමේන්තු වෙබ් අඩවියේ පළ කර ඇති අතර, මුද්‍රණය කරන ලද පොත් පිරිවෙන්වලට බෙදා දීම සිදු කරන ලදි.

3. 12 ශ්‍රේණියේ දී පැවැත්වෙන සාමාන්‍ය තොරතුරු තාක්ෂණ විභාගය දැනට ලිඛිත පරීක්ෂණයක් වශයෙන් පැවැත්වෙන අතර මෙය ප්‍රායෝගික කුසලතා

මැන බැලිය හැකි ආකාරයට 2018 වසරේ සිට මාර්ගගත විභාගයන් (Online Test) ලෙස පැවැත්වීම සඳහා අවශ්‍ය මෘදුකාංග සංවර්ධනය කර ඇති අතර, නියාමන පරීක්ෂණ දෙකක් ( Online) සකස් කර අන්තර්ජාලයට මුදාහැර ඇති අතර, අවසන් විභාගයට පෙර ඒ හා සමාන ආකාරයට MOCK විභාගයක් පැවැත්වීමට සූදානම් කර ඇත. මෙම සාමාන්‍ය තොරතුරු තාක්ෂණ (Online) විභාගයට අදාළ ව ප්‍රශ්න පත්‍ර ව්‍යූහය හා මූලාකෘති ප්‍රශ්න ඇතුළත් පොත් සකස් කර ඒවා දෙපාර්තමේන්තු වෙබ් අඩවියට ඇතුළත් කර ඇති අතර, මුද්‍රිත පොත් පාසල් වෙත බෙදා හැරීමට සූදානම් කර ඇත.

4. ඇගයීම් වාර්තා සකස් කිරීම

4.1 අ.පො.ස. (උ.පෙළ) 2016 විභාගයේ ප්‍රශ්න පත්‍රවලට පිළිතුරු සැපයීමේ දී හඳුනා ගත් අයදුම්කරුවන්ගේ දුර්වලතා/ප්‍රබලතා/ අඩුපාඩු විශ්ලේෂණය කරමින් ඒවා මඟහරවා ගන්නා ආකාරය ඇතුළත් කොට සකස් කරන ලද අ.පො.ස. (උ.පෙළ) 2016 විභාගයට අදාළ ඇගයීම් වාර්තා පාසල් වෙත ලබා දී ඇත.

4.2. අ.පො.ස.(උ.පෙළ) විභාගය 2016 විභාගයේ ඉංජිනේරු තාක්ෂණවේදය, ජෛව පද්ධති තාක්ෂණවේදය සහ තාක්ෂණවේදය සඳහා විද්‍යාව යන විෂයයන්හි ඇගයීම් වාර්තා සකස් කර මුද්‍රණය කර, පාසල්වලට බෙදා දීම සහ දෙපාර්තමේන්තු වෙබ් අඩවියේ පළ කරන ලදි.

5. විශ්ලේෂණ කටයුතු සඳහා දත්ත ලබා ගැනීමට අවශ්‍ය වන ආකාරයට 2018 වර්ෂයේ 5 ශ්‍රේණිය ශිෂ්‍යත්ව විභාගය, අ.පො.ස. (උ.පෙළ) විභාගය සහ අ.පො.ස. (සා.පෙළ) විභාගය සඳහා RD ආකෘති පත්‍ර සකස් කිරීම හා ඒවා ඇගයීම් මණ්ඩලවලට බෙදා දීම සිදු කරන ලදි.

6. 5 ශ්‍රේණිය ශිෂ්‍යත්ව විභාගය 2017 හි සාධන තත්ත්වයන් පිළිබඳව විශ්ලේෂණය කර, විශ්ලේෂණ වාර්තා සකස් කරන ලද අතර, අධ්‍යාපන අමාත්‍යාංශයේ ප්‍රාථමික අධ්‍යාපන අංශය මගින් දිවයිනේ සියලුම ප්‍රාථමික අධ්‍යාපන අධ්‍යක්ෂවරුන්, ප්‍රාථමික අධ්‍යාපනය පිළිබඳ පළාත් සම්බන්ධීකරණ නිලධාරීන්, ප්‍රාථමික අධ්‍යාපන ගුරු උපදේශකවරුන් සඳහා සංවිධානය කර පවත්වන ලද වැඩමුළුවේ දී එම තොරතුරු ඉදිරිපත් කරන ලදී.

7. අ.පො.ස. (උ.පෙළ) විභාගයේ ඉංග්‍රීසි (73) විෂයයෙහි පිළිතුරු පත් ඇගයීම සඳහා ගුරුභවතුන් පුහුණු කිරීමේ වැඩමුළුවක් සංවිධානය කිරීම.

8. ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුවේ භාෂා පරීක්ෂණ සකසන සම්පත් පුද්ගලයින් සහ භාෂා පරීක්ෂණ පිළිබඳ වගකීම උසුලන නිලධාරීන් සඳහා දෙවන භාෂාව සහ විදේශීය භාෂා පරීක්ෂණ සැකසීමේ වැඩමුළුවක් Test Development Training and Analysis Limited ආයතනයේ Dr.Rita Green මහත්මිය සහභාගී කරවාගෙන Waters Edge ආයතනයේ දී පවත්වන ලදි.

9. අභියෝගාත්මකතාව හා බුද්ධි පරීක්ෂණ ප්‍රශ්න ඇතුළත් අයිතම සංචිතයක් සඳහා මාර්ගෝපදේශ සංග්‍රහයක් සැකසීමේ නේවාසික වැඩමුළුවක් විශ්ව විද්‍යාල මහාචාර්ය/ආචාර්ය/කථිකාචාර්ය හා රාජ්‍ය පරිපාලන ක්ෂේත්‍රයෙහි ඒ ඒ විෂයයන්හි නිපුණතාවක් දක්වන සම්පත් පුද්ගලයින් සහභාගී කරවාගෙන වාද්දුව ටැන්ජරින් බීච් හෝටලයේදී පවත්වන ලදි.

10. ආයතනික විභාග සඳහා විවෘත ග්‍රන්ථ පරීක්ෂණ ක්‍රමවේදය භාවිත කළ හැකි ආකාරය පිළිබඳ මූලික සාකච්ඡාවක් සඳහා වැඩමුළු පැවැත්වීම.

11. මානව සම්පත් සංවර්ධනය

- මාර්ගගත ක්‍රමයට විභාග පැවැත්වීම ඇතුළු මිනුම් හා ඇගයුම් පිළිබඳ ව මැලේසියාවේ පැවති පුහුණු වැඩසටහන් සඳහා දෙපාර්තමේන්තු නිලධාරීන් කණ්ඩායම් දෙකක් සහභාගී කරවන ලදි.

**2019 වර්ෂය සඳහා සැලසුම් කර ඇති වැඩසටහන්**

- ප්‍රශ්න පත්‍ර සකස් කිරීම හා ඇගයීම් වාර්තාවල ඇතුළත් තොරතුරු අපේක්ෂකයන්ගේ සාධන මට්ටම වැඩි කිරීම සඳහා යොදා ගන්නා ආකාරය පිළිබඳ ව පළාත් මට්ටමින් ගුරුභවතුන් පුහුණු කිරීම සඳහා පුහුණුකරුවන් පුහුණු කිරීමේ නේවාසික වැඩමුළු ඌව, සබරගමුව, දකුණ, බස්නාහිර, උතුර හා නැගෙනහිර පළාත් සඳහා සංවිධානය කර පැවැත්වීම.

- ආයතනික විභාග සහ පාසල් විභාග ප්‍රශ්න පත්‍රවල ගුණාත්මකභාවය වර්ධනය කිරීම සඳහා අයිතම රචනයන් පුහුණු කිරීම හා අයිතම සංචිතයන් ස්ථාපිත කිරීම.

- 5 ශ්‍රේණිය ශිෂ්‍යත්ව විභාගය, අ.පො.ස. (සා.පෙළ) විභාගය සහ අ.පො.ස. (උ.පෙළ) විභාගයේ ප්‍රතිඵල/ලකුණුවල සම්බන්ධතාව පිළිබඳව පර්යේෂණයක් සිදු කිරීම.

- ඇගයීම් හා තක්සේරුකරණය පිළිබඳ විදේශීය පශ්චාත් උපාධි පාඨමාලා සඳහා නිලධාරීන් දෙදෙනෙකු සහභාගී කරවීම.

- තාක්ෂණවේදය විෂයයන්හි ප්‍රායෝගික හැකියා තක්සේරුකරණය පිළිබඳ කෙටිකාලීන විදේශීය පුහුණු පාඨමාලා සඳහා නිලධාරීන් සහභාගී කරවීම.

- ප්‍රශ්න පත්‍ර සැකසීම ඇතුළු ඇගයීම් හා තක්සේරුකරණය පිළිබඳ කෙටිකාලීන විදේශීය පුහුණු පාඨමාලා සඳහා නිලධාරීන් සහභාගී කරවීම.

- ඇගයීම් හා තක්සේරුකරණය ක්ෂේත්‍රයේ ගෝලීය ප්‍රවණතා හා වෙනස්කම් පිළිබඳව අවබෝධයක් ලබා ගැනීම කාලීන අවශ්‍යතාවක් වන බැවින් එම ක්ෂේත්‍රයේ ගෝලීය පිළිගැනීමක් ඇති International Association for Education Assessment (IAEA), International Language Testing Association (ILTA), The Network on Education Quality Maintaining in Asia Pacific (NEQMAP) වැනි ආයතනවල සාමාජිකත්වය ලබා ගෙන ඒවායේ විවිධ වැඩසටහන් නියෝජනය කිරීම.

- රජයේ හා වෙනත් ආයතනවල විවිධ රැකියා සඳහා නිලධාරීන් බඳවා ගැනීමේ විභාගවල කාර්යක්ෂමතාව හා ඵලදායිතාව වැඩි කිරීම සඳහා, බුද්ධි පරීක්ෂණ, අභියෝග්‍යතාව හා අවබෝධය පරීක්ෂණ සඳහා ප්‍රශ්න ඇතුළත් සංචිතයක් (Item Pool) පිහිටුවීම.

- රාජ්‍ය අංශයේ විවිධ තනතුරුවල නිලධාරීන් සඳහා පැවැත්වෙන කාර්යක්ෂමතා කඩඉම් විභාග සඳහා විවෘත ග්‍රන්ථ පරීක්ෂණ (Open Book Test) ක්‍රමවේදය භාවිත කිරීමට අදාළ මාර්ගෝපදේශ සංග්‍රහයක් සැකසීම.

- සාමාන්‍ය තොරතුරු තාක්ෂණ විභාගය Online ක්‍රමයට පැවැත්වීම.

## 2.7 සංවිධාන හා විදේශ විභාග ශාඛාව

පාසල් විභාග හැර දේශීය වශයෙන් පැවැත්වෙන බඳවා ගැනීමේ විභාග, කාර්යක්ෂමතා කඩඉම් විභාග, උසස් කිරීමේ විභාග, සහතික පත්‍ර විභාග සහ වෙනත් විභාග ද, විදේශීය විභාග ද සංවිධානය කිරීම හා පැවැත්වීමට අදාළ කාර්යයන් මෙම ශාඛාව මගින් ඉටු කරනු ලබයි.

| | |
|---|---|
| බඳවා ගැනීමේ විභාග | රාජ්‍ය, අර්ධ රාජ්‍ය, රාජ්‍ය බැංකු ආදී ලෙස ඇති විවිධ ආයතනයන්හි අවශ්‍යතා මත කෙරෙන සියලුම බඳවා ගැනීමේ විභාග. |
| කාර්යක්ෂමතා කඩඉම් විභාග | රාජ්‍ය සේවයේ නියුක්ත විවිධ මට්ටම්වල නිලධාරීන්ගේ සහ සේවකයින්ගේ කාර්යක්ෂමතාව වර්ධනය කිරීම සඳහා, තනතුරට අදාළ විෂය දැනුම පරීක්ෂා කිරීම |
| උසස් කිරීමේ විභාග | රාජ්‍ය, අර්ධ රාජ්‍ය සහ රාජ්‍ය බැංකු ආදී ආයතනයන්හි සේවයේ නියැලෙන නිලධාරීන් කුසලතා මත ඉහළ තනතුරුවලට උසස් කිරීම සඳහා පැවැත්වෙන විභාග |
| සහතික පත්‍ර විභාග | රාජ්‍ය සහ අර්ධ රාජ්‍ය ආයතන මගින් විවිධ පාඨමාලා සඳහා තෝරා ගැනීම සහ සහතික පත්‍ර හෝ බලපත්‍ර නිකුත් කිරීම සඳහා පවත්වන විභාග |
| වෙනත් විභාග | බෞද්ධ, හින්දු, ඉස්ලාම්, කතෝලික යන ආගම්වලට අදාළව විවිධ මට්ටම් සඳහා පවත්වන විභාග සහ බටහිර සංගීත, ජාතික නැටුම්/ සංගීත විභාග ආදී සහතික පත්‍ර ප්‍රදානය කෙරෙන විභාග |
| විදේශ විභාග | විදේශීය, විශ්ව විද්‍යාල සහ වෙනත් අධ්‍යාපනික ආයතනවලට අදාළව මෙරට අපේක්ෂකයින් සඳහා සංවිධානය කෙරෙන විභාග |

උක්ත විභාග සංවිධානය කිරීමේ දී සෑම වසරක් අවසානයේදීම ඉදිරි වසර සඳහා යෝජිත විභාග පිළිබඳව තොරතුරු ඒ ඒ ආයතනයන්ගෙන් ලබාගෙන ඒ අනුව වාර්ෂික විභාග වැඩසටහන සකස් කරනු ලැබේ.

විවිධ ආයතනයන්ට අදාළව, වාර්ෂික වැඩසටහනට ඇතුළත් විභාග සඳහා, කෙටුම්පත් කරන ලද අයදුම්පත් කැඳවීමේ ගැසට් නිවේදන හෝ අභ්‍යන්තර චක්‍රලේඛ සඳහා නිරීක්ෂණ ලබාදීමත්, ඒ අනුව සංශෝධිත විභාග නිවේදන පළකිරීම සඳහා එකඟතාව ලබාදීමත්, මෙම ශාඛාවේ ප්‍රධාන කාර්යභාරයකි.

ඒ ඒ විභාග සඳහා විභාග මධ්‍යස්ථාන වෙන්කර ගැනීම, ප්‍රවේශ පත්‍ර නිකුත් කිරීම, විභාග රාජකාරි සඳහා නිලධාරීන් පත්කිරීම සහ සම්බන්ධීකරණය කිරීම, ප්‍රශ්න පත්‍ර මුද්‍රණය සහ ඇසුරුම් කටයුතු සඳහා සංඛ්‍යාලේඛන වාර්තා ලබාදීම, විභාග පැවැත්වෙන අවස්ථාවන්හි දී පැන නගින ගැටලු සඳහා විසඳුම් ලබාදීම, ආදී සියලු කටයුතුවලට අමතරව ප්‍රවේශ පත්‍ර සම්බන්ධයෙන් පැන නගින ගැටලු නිරාකරණය කිරීම ද සමහර විභාගයන්ට අදාළව, අවශ්‍යතාව පරිදි විභාග ශාලාධිපතිවරුන් සහ සම්බන්ධීකරණ නිලධාරීන් සඳහා උපදෙස් සම්මන්ත්‍රණ පැවැත්වීම ද මෙම ශාඛාව සතු කාර්යයන් වේ.

**2018 වර්ෂය තුළ ඉටු කරන ලද කාර්යයන්**

| පවත්වන ලද විභාග වර්ගය | පවත්වන ලද සංඛ්‍යාව | අපේක්ෂක සංඛ්‍යාව | ආදායම (රුපියල්) | විභාග පරිපාලන කාර්යය සඳහා යෙදවූ සංඛ්‍යාව |
|---|---|---|---|---|
| බඳවා ගැනීමේ විභාග | 56 | 189,216 | 82,682,928.80 | 25,207 |
| සහතික පත්‍ර විභාග | 23 | 170,453 | 11,656,512.50 | 15,613 |
| කාර්යක්ෂමතා කඩඉම් විභාග | 44 | 61,305 | 20,394,558.20 | 6,214 |
| උසස් කිරීමේ විභාග | 14 | 11,905 | 4,207,420.75 | 1,118 |
| විදේශ විභාග | 13 | 4,100 | 391,902.50 | 299 |
| වෙනත් | 04 | 8,934 | 4,900,903.50 | 571 |
| එකතුව | 154 | 445,913 | 124,234,226.25 | 49,022 |

## 2.8 රහස්‍ය (ආයතනික විභාග) ශාඛාව

සංවිධාන හා විදේශ විභාග ශාඛාව මගින් සංවිධානය කරනු ලබන විභාග සඳහා සිංහල, දෙමළ සහ ඉංග්‍රීසි යන භාෂා ත්‍රිත්වයෙන්ම පරීක්ෂකවරුන් වශයෙන් ප්‍රවීණයන් පත් කිරීම මගින් ගුණාත්මක බවින් ඉහළ ඇගයීම් උපකරණ සකස් කිරීම මෙම ශාඛාවේ ප්‍රධානතම කාර්යය වේ. ඊට අමතරව ප්‍රශ්න පත්‍ර මුද්‍රණය කිරීම, මධ්‍යස්ථාන අනුව ඇසුරුම් කිරීම සහ සම්බන්ධීකරණ මධ්‍යස්ථානවලට හෝ විභාග මධ්‍යස්ථානවලට බෙදා හැරීම දක්වා වූ ක්‍රියාවලිය මෙම ශාඛාවෙන් සිදුවන කාර්යයන් වේ.

මෙම ශාඛාවෙන් ඉදිරියේදී ඉටු කිරීමට බලාපොරොත්තු වන ව්‍යාපෘති

- රාජ්‍ය සේවයේ නිලධාරීන්ගේ කාර්යක්ෂමතා කඩඉම් විභාග සඳහා සමහර විෂයයන් විවෘත ග්‍රන්ථ පරීක්ෂණ ලෙස පැවැත්වීම.
- රාජ්‍ය සේවයේ නිලධාරීන්ගේ කාර්යක්ෂමතා කඩඉම් විභාග සඳහා ඔවුන්ගේ කාර්ය සාධන වාර්තා වලට (Portfolio) යම් ලකුණු ප්‍රමාණයක් ලබාදීම පිළිබඳව සොයා බැලීම.
- ආයතනික විභාග සඳහා මාර්ගගත (Online) ක්‍රමවේදය අත්හදා බැලීම.
- අභියෝග්‍යතාව ප්‍රශ්න සඳහා අයිතම සංචිතයක් (Item pool) සකස් කිරීම.

**2018 වර්ෂය තුළ ඉටු කරන ලද කාර්යයන්**

| පවත්වන ලද විභාග වර්ගය | පවත්වන ලද විභාග සංඛ්‍යාව | අපේක්ෂක සංඛ්‍යාව | සකස් කළ ප්‍රශ්න පත්‍ර සංඛ්‍යාව (මාධ්‍ය අනුව) | | | | මුද්‍රණය කළ ප්‍රශ්න පත්‍ර සංඛ්‍යාව (මාධ්‍ය අනුව) | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|
| | | | සිංහල | දෙමළ | ඉංග්‍රීසි | එකතුව | සිංහල | දෙමළ | ඉංග්‍රීසි | එකතුව |
| බඳවා ගැනීමේ විභාග | 56 | 201,682 | 134 | 123 | 102 | 359 | 414,781 | 92,731 | 48,513 | 556,025 |
| සහතික පත්‍ර විභාග | 19 | 141,776 | 222 | 39 | 88 | 349 | 227,264 | 44,775 | 21,294 | 293,333 |
| කාර්යක්ෂමතා කඩඉම් විභාග | 48 | 51,285 | 122 | 93 | 75 | 290 | 92,835 | 23,475 | 4,025 | 120,335 |
| උසස් කිරීමේ විභාග | 9 | 14,192 | 22 | 19 | 6 | 47 | 353,065 | 7,665 | 2,520 | 363,250 |
| විදේශ විභාග | 10 | 2,297 | 8 | 8 | 30 | 46 | 1,646 | 386 | 7,506 | 9,538 |
| එකතුව | 142 | 411,232 | 508 | 282 | 301 | 1,091 | 1,089,591 | 169,032 | 83,858 | 1,342,481 |

## 2.9 ඇගයීම් (ආයතනික විභාග) ශාඛාව

දෙපාර්තමේන්තුව මගින් සිදු කරනු ලබන සියලුම ආයතනික විභාග, එනම් රාජ්‍ය, අර්ධ රාජ්‍ය ආයතන සඳහා නිලධාරීන් බඳවා ගැනීම, උසස් කිරීම් හා කාර්යක්ෂමතා කඩඉම් විභාග සියල්ලෙහිම පිළිතුරු පත්‍ර ඇගයීම් කටයුතු සිදු කරනු ලබන්නේ මෙම ශාඛාව මගිනි. විවිධ ක්ෂේත්‍රවලට අදාළ ප්‍රවීණයන් අතුරෙන් සුදුසු පිළිතුරු පත්‍ර පරීක්ෂකවරුන් තෝරා ගැනීම, පාලක පිළිතුරු පත්‍ර ලකුණු කිරීම, ඇගයීම් පිළිබඳව පරීක්ෂකවරුන් දැනුවත් කිරීම, සම්මේලන ක්‍රමයට පිළිතුරු පත්‍ර ලකුණු කිරීම හා අවසානයේ ලකුණු ලැයිස්තු ප්‍රතිඵල ශාඛාවට භාර දීම දක්වා වූ ඇගයීම් ක්‍රියාවලිය සිදු කරනු ලබන්නේ මෙම ශාඛාව මගිනි.

**2018 වර්ෂය තුළ ඉටු කරන ලද කාර්යයන්**

| විභාග වර්ගය | පිළිතුරුපත් සංඛ්‍යාව | ඇගයීම් සඳහා යෙදවූ පරීක්ෂකවරුන් සංඛ්‍යාව |
|---|---|---|
| බඳවා ගැනීමේ විභාග | 211,686 | 2,255 |
| උසස් කිරීම් විභාග | 21,827 | 124 |
| කාර්යක්ෂමතා කඩඉම් විභාග | 51,173 | 539 |
| සහතික පත්‍ර විභාග | 305,952 | 2,356 |
| වෙනත් | 11,686 | 151 |
| **එකතුව** | **602,324** | **5,425** |

## 2.10 ප්‍රතිඵල (ආයතනික විභාග) ශාඛාව

ඇගයීම් ආයතනික විභාග ශාඛාව සමග අත්‍යන්ත සම්බන්ධතාවක් පවත්වා ගෙන යනු ලබන ප්‍රතිඵල ශාඛාවෙන් වාර්ෂිකව පැවැත්වෙන සියලුම ආයතනික විභාගවල ප්‍රතිඵල නිකුත් කිරීමේ කටයුතු සිදු කරනු ලබන අතර, ගැසට් නිවේදන /චක්‍රලේඛවලට අනුව දෙපාර්තමේන්තු ක්‍රමවේද උපයෝගී කර ගනිමින් පැමිණීමේ ලේඛන පරීක්ෂාව, ප්‍රවේශ පත්‍ර පරීක්ෂාව, ලකුණු ඌණතා පරීක්ෂාව, මධ්‍යස්ථාන මාරු හා විෂය මාරු පරීක්ෂාව, අසාමාන්‍ය ලකුණු වාර්තා පිළියෙල කිරීම, අයදුම්පත් තේරීම හා අයදුම්පත් සමග ප්‍රතිඵල ලේඛන පරීක්ෂා කිරීම යනාදී කටයුතුවලින් අනතුරුව පැහැදිලිවූත් නිවැරදිවූත් ප්‍රතිඵල ලේඛන සකස් කර අදාළ අමාත්‍යාංශ, දෙපාර්තමේන්තු, රාජ්‍ය බැංකු, අර්ධ රාජ්‍ය ආයතන, සියලුම දහම් පාසල්, සියලුම පිරිවෙන් සහ සියලුම අයදුම්කරුවන් වෙත ප්‍රතිඵල ලබා දීම මෙම ශාඛාවේ කාර්යභාරය වේ.

2018 වර්ෂය තුළ ඉටු කරන ලද කාර්යයන්

| විභාග වර්ගය | ප්‍රතිඵල නිකුත් කළ විභාග සංඛ්‍යාව | අපේක්ෂක සංඛ්‍යාව |
|---|---|---|
| බඳවා ගැනීමේ විභාග | 51 | 137,490 |
| උසස් කිරීමේ විභාග | 11 | 3,069 |
| සහතික පත්‍ර විභාග | 21 | 168,829 |
| කාර්යක්ෂමතා කඩඉම් විභාග | 38 | 22,794 |
| වෙනත් විභාග | 05 | 7,937 |
| එකතුව | 126 | 340,119 |

උක්ත වගුවේ සඳහන් වන්නේ 2017 වර්ෂයේ පැවැත්වූ නමුත් 2018 වර්ෂයේදී ප්‍රතිඵල නිකුත් වූ විභාග සහ 2018 වර්ෂයේ පවත්වා එම වර්ෂයේම ප්‍රතිඵල නිකුත් කරන ලද විභාග සංඛ්‍යාවේ එකතුවයි.

## 2.11 ආයතන ශාඛාව

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුවේ සියලුම පරිපාලනමය කටයුතු සිදු කරනු ලබන්නේ ආයතන ශාඛාව මගිනි. ආයතන කටයුතු මෙන්ම විනය කටයුතු ද ආයතන ශාඛාවෙන් සිදු කරනු ලබන අතර නිලධාරීන් හා සේවක කාර්ය මණ්ඩලය බඳවා ගැනීම, සේවයේ යෙදවීම, වාර්ෂික ස්ථාන මාරුවීම්, කාර්ය මණ්ඩල විශ්‍රාම ගැන්වීමට අදාළ රාජකාරි, පෞද්ගලික ලිපි ගොනු පවත්වාගෙන යාම හා දෙපාර්තමේන්තු කාර්ය මණ්ඩලයේ සියලුම දෙනාගේ සුබසාධක අවශ්‍යතා අධ්‍යාපන අමාත්‍යාංශය, රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශය, විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුව, ජාතික රක්ෂණ භාර අරමුදල වැනි රාජ්‍ය හා අර්ධ රාජ්‍ය ආයතන සමග සම්බන්ධ වෙමින් සිදු කරනු ලබයි.

තැපැල් ශාඛාව, ප්‍රවාහන අංශය, ඡායා පිටපත් අංශය, ගොඩනැගිලි අංශය, පවිත්‍රතා ඒකකය, ආරක්ෂක කටයුතු, විමසීම් අංශය, විදුලි අංශය, නඩත්තු අංශය සහ දුරකතන හුවමාරු ඒකකය ආයතන ශාඛාවේ අධීක්ෂණය යටතේ ක්‍රියාත්මක වන අංශ වේ. මේ සියලු අංශ විධිමත් ලෙස ක්‍රියාත්මක වීම දෙපාර්තමේන්තුවේ සියලු කාර්යයන් සඳහා ඍජුව බලපායි. මෙම ශාඛාව අනෙකුත් සියලුම ශාඛා සමග සම්බන්ධ වෙමින් නිරන්තර සම්බන්ධීකරණයක් පවත්වා ගනිමින් නිවැරදි ලෙසත්, විධිමත් ලෙසත් කාර්යක්ෂමව කටයුතු කරන අතර ආයතන ශාඛාව වෙත විශාල වගකීම් රාශියක් පැවරී ඇත.

## 2.12 තැපැල් ශාඛාව

දෙපාර්තමේන්තුව වෙත ලැබෙන සහ විවිධ ආයතන හා පුද්ගලයන් වෙත තැපැල් කරනු ලබන සියලුම ලිපි පිළිබඳ සියලු කටයුතු සිදු කරනු ලබන්නේ තැපැල් ශාඛාව මගිනි. දෛනිකව මෙම අංශයට ලැබෙන දහස් සංඛ්‍යාත ලිපි අදාළ ශාඛා අනුව, විභාග අනුව වෙන් කරනු ලබන අතර, පසුව ඒවා විවෘත කර ලියාපදිංචි අංකය සටහන් කර, ගොනු කර, අදාළ ශාඛා වෙත ලබා දෙනු ලබයි. පාසල් සහ අනෙකුත් විභාග අයදුම්පත් ලක්ෂ ගණනක් පරීක්ෂා කිරීමේදී ඉතා නිවැරදිව, ක්‍රමානුකූලව සහ කාර්යක්ෂමව මේ කාර්යයන් සිදුකරනු ලබයි.

| කාර්යය | ලිපි සංඛ්‍යාව | මුදල (රුපියල්) |
|---|---|---|
| ලැබී ඇති සාමාන්‍ය ලිපි | 137,201 | |
| ලියාපදිංචි තැපෑලෙන් එවන ලිපි | 511,821 | |
| මෙම දෙපාර්තමේන්තුවෙන් තැපැල් දෙපාර්තමේන්තුව වෙත භාරදී ඇති සාමාන්‍ය ලිපි | 717,581 | |
| සාමන්‍ය ලිපි තැපැල් කිරීම සඳහා වැය වූ මුදල | | 9,791,120.00 |
| තැපැල් දෙපාර්තමේන්තුවට භාරදී ඇති ලියාපදිංචි ලිපි | 21,189 | |
| ලියාපදිංචි ලිපි තැපැල් කිරීම සඳහා වැය වූ මුදල | | 1,379,745.00 |

## 2.13 ගිණුම් ශාඛාව

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව විසින් පවත්වනු ලබන සියලුම විභාගවල පරිපාලන හා ඇගයීම් කටයුතු ඇතුළු දෙපාර්තමේන්තුවේ සියලුම අයවැය ගත ගෙවීම් කටයුතු මෙන්ම වාර්ෂික ආදායම් ගිණුම් ගත කිරීම හා වාර්තා කිරීම සිදු කරනු ලබන්නේ ගිණුම් ශාඛාව විසිනි.

වාර්ෂිකව රුපියල් මිලියන 3500කට අධික අයවැයගත ඇස්තමේන්තු ප්‍රතිපාදනවල මූල්‍ය කළමනාකරණය හා වාර්තා කිරීම සිදු කරන අතර වසරකට වවුචර් 260,000ක් පමණ ගෙවීම් කටයුතු සිදු කරනු ලැබේ. වඩාත් නිවැරදිව ගණනය කිරීම මත විභාග සම්බන්ධ රාජකාරි නිමවූ වහාම අදාළ ගෙවීම් කටයුතු සිදු කර අවසන් කිරීම ගිණුම් අංශයේ වගකීම වේ.

| වැය ශීර්ෂගත වියදම | වාර්ෂික ප්‍රතිපාදනය (රු.) | 2018 දෙසැම්බර් 31 දිනට වියදම (රු.) |
|---|---|---|
| පෞද්ගලික පඩිනඩි | 328,500,000.00 | 321,671,956.00 |
| වෙනත් පුනරාවර්තන වියදම් | 2,884,300,000.00 | 2,839,333,284.00 |
| අතිරේක ප්‍රතිපාදන | - | - |
| මුළු පුනරාවර්තන වියදම් | 3,212,800,000.00 | 3,161,005,240.00 |
| මූලධන වියදම් | | |
| පුනරුත්ථාපන හා වැඩිදියුණු කිරීම | - | - |
| ගොඩනැගිලි හා ඉදිකිරීම් | 59,000,000.00 | 5,781,159.00 |
| යන්ත්‍ර හා උපකරණ | 6,000,000.00 | 2,952,401.00 |
| වාහන | 6,000,000.00 | 2,064,659.00 |
| එකතුව | 71,000,000.00 | 10,798,219.00 |
| මූලධන වත්කම් අත්පත් කර ගැනීම | | |
| ගෘහ භාණ්ඩ හා කාර්යාලයීය උපකරණ | 4,000,000.00 | 3,927,531.00 |
| එකතුව | 4,000,000.00 | 3,927,531.00 |
| මානව සම්පත් සංවර්ධනය | | |
| කාර්ය මණ්ඩල පුහුණු | 3,000,000.00 | 1,480,140.00 |
| එකතුව | 3,000,000.00 | 1,480,140.00 |
| සංවර්ධන සැලැස්ම | | |
| යන්ත්‍ර සහ යන්ත්‍රෝපකරණ | 530,000,000.00 | 529,038,315.00 |
| ගොඩනැගිලි සහ ඉදිකිරීම් | 136,000,000.00 | 60,991,006.00 |
| එකතුව | 666,000,000.00 | 590,029,321.00 |
| TSEP | 75,000,000.00 | 56,550,139.00 |
| එකතුව | 75,000,000.00 | 56,550,139.00 |
| **මුළු මූලධන වියදම්** | **819,000,000.00** | **662,785,350.00** |
| **මුළු එකතුව** | **4,031,800,000.00** | **3,823,790,590.00** |

| වාර්ෂික ආදායම | ඇස්තමේන්තුව (රු.) | තථ්‍ය ආදායම (රු.) |
|---|---|---|
| විභාග ගාස්තු හා වෙනත් | (සංශෝධිත) 300,000,000.00 | 287,193,870.53 |
| රාජ්‍ය නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම | සීමාව (රු.) | 2018.12.31 දිනට තථ්‍ය (රු.) |
| උපරිම හර සීමාව | 35,000,000.00 | 33,972,605.00 |
| අවම බැර සීමාව | 2,000,000.00 | 21,411,507.38 |
| උපරිම හර ශේෂ සීමාව | 100,000,000.00 | 89,200,641.29 |

## 2.14 සැපයීම් ශාඛාව

සියලුම විභාග සඳහා අවශ්‍ය පුනරාවර්තන භාණ්ඩ මිලදී ගැනීම හා බෙදා හැරීමත් මූලධන වත්කම් මිලදී ගැනීම හා නඩත්තු කිරීමත් මෙම ශාඛාවෙන් ඉටු වේ.

ප්‍රධාන වශයෙන් 2018 වර්ෂය තුළ පවත්වන ලද අ.පො.ස. (සා.පෙළ), අ.පො.ස. (උ.පෙළ) සහ 5 වන ශ්‍රේණියේ ශිෂ්‍යත්ව විභාග සමග වෙනත් ආයතනික විභාග, බඳවා ගැනීමේ විභාග රාශියක් සඳහා කිසිදු ප්‍රමාදයකින් තොරව සියලුම ලිපිද්‍රව්‍ය බෙදා හැරීම සිදුකරන ලදී. මේ යටතේ උක්ත විභාගවලට අවශ්‍ය උත්තර ලියන පොත්, කඩදාසි, ලිපි කවර, නූල්, ගම් ආදී සියලුම ලිපිද්‍රව්‍ය සැපයීම සඳහා ලියාපදිංචි ආයතනවලින් මිල ගණන් කැඳවා තාක්ෂණ ඇගයීම් කමිටු නිර්දේශ පරිදි ප්‍රසම්පාදන කටයුතු සිදු කර ඇත.

පසුගිය වර්ෂවල විනාශ කළ යුතු උත්තර පත්‍ර, ප්‍රශ්න පත්‍ර සහ අනෙකුත් ඉවතලන රහස්‍ය කඩදාසි වාලච්චේන කඩදාසි කම්හල වෙත ප්‍රතිචක්‍රීකරණය සඳහා භාර දී ඇත.

වාර්ෂික භාණ්ඩ සමීක්ෂණ මණ්ඩල මගින් අපහරණය කිරීම සඳහා අපහරණ මණ්ඩලයේ අනුමැතිය පරිදි ගබඩා වෙත භාර දෙන ලද භාණ්ඩ විවෘත වෙන්දේසියේ වැඩිම මිල ඉදිරිපත් කර ඇති ගැනුම්කරුට විකුණා අදාළ වටිනාකම් රජයේ ආදායමට බැර කර ඇත. දෙපාර්තමේන්තුව සතුව එක් එක් ශාඛාව යටතේ ඇති ඡායා පිටපත් යන්ත්‍ර, පරිගණක යන්ත්‍ර, අනුපිටපත් යන්ත්‍ර, ෆැක්ස් යන්ත්‍ර, මුද්‍රණාලයේ මුද්‍රණ යන්ත්‍ර ආදී සියලුම යන්ත්‍රවල අලුත්වැඩියා සිදුකිරීම හා නඩත්තු කිරීමට අදාළ කටයුතු ඉටු කර ඇත. ප්‍රශ්නපත්‍රවල රහස්‍යභාවය උපරිම වශයෙන් ආරක්ෂාවන කාර්යක්ෂමතාව වැඩි මුද්‍රණ යන්ත්‍ර රහස්‍ය අංශවලට සපයා ඇත. Turn Key මුද්‍රණ යන්ත්‍රය මගින් කාර්යක්ෂමතාවයෙන් යුතුව විභාග ප්‍රශ්න පත්‍ර මුද්‍රණ කටයුතු සිදු කර දෙපාර්තමේන්තු සම්පූර්ණ විදුලිබිල අවම වන පරිදි සූර්ය බල පද්ධතිය ස්ථාපනය කර සූර්ය පහන් කණු ස්ථාපිත කර ප්‍රයෝජනයට ගන්නා

අතර එමගින් මාස 08කට කිලෝවොට් පැය 217,082.82 ක පමණ ධාරිතාවක් උත්පාදනය කිරීම හා රු. 4,732,405.50 ක පමණ ශුද්ධ ලාභයක් ඉපයීම.

ඇසුරුම් කටයුතු වඩාත් පහසුවෙන් එක් ස්ථානයක සිදුකර ගැනීමට අවශ්‍ය වන පරිදි දැනට ඇති ඇසුරුම් කාමරය පුළුල් කිරීම දෙපාර්තමේන්තුවේ රාජකාරි කටයුතු වඩාත් කාර්යක්ෂම කිරීම සඳහා නව පරිගණක හා අදාළ තාක්ෂණික උපකරණ ලබා දීම.

2018 වර්ෂයේ සිට සාමාන්‍ය තොරතුරු තාක්ෂණ විභාගය online ක්‍රමය යටතේ පැවැත්වීමට අවශ්‍ය සියලු කටයුතු සම්පාදනය කිරීම.

දෙපාර්තමේන්තුවකට අවශ්‍ය නිර්මාණාත්මක වෙබ් අඩවියක් නොමිලේ නිර්මාණය කර ගැනීමට අවශ්‍ය කටයුතු සම්පාදනය කිරීම.

විභාග පරිපාලනය සඳහා දිවයින පුරා පිහිටුවනු ලබන ප්‍රාදේශීය එක්රැස් කිරීමේ මධ්‍යස්ථාන හා සම්බන්ධීකරණ මධ්‍යස්ථාන සඳහා රහස්‍ය ලේඛනවල ආරක්ෂාව වඩාත් හොඳින් තහවුරු කිරීම සඳහා ද්විත්ව අගුළු සහිත වානේ අල්මාරි 1,300 ක් සැපයීමට කටයුතු කිරීම.

දෙපාර්තමේන්තු ගොඩනැගිලි අලුත්වැඩියා හා නඩත්තු කටයුතු දෙපාර්තමේන්තු නිලධාරීන්ගේ සුබසාධනය උදෙසා ආපනශාලාව, ආරක්ෂාව සඳහා ආරක්ෂක අංශය හා පවිත්‍රතාවය සඳහා පවිත්‍රතා අංශය පවත්වාගෙන යාමට අදාළ ප්‍රසම්පාදන කටයුතු හා අනෙකුත් කටයුතු ඉටු කර ඇත.

## 2.15. මුද්‍රණාලය

### 2.15.1 මුද්‍රණාලය (රහස්‍ය)

දෙපාර්තමේන්තුවේ සියලුම විභාග සඳහා ප්‍රශ්න පත්‍ර මුද්‍රණය කරනු ලබන්නේ මෙම මුද්‍රණාලයෙනි. අතිශයින්ම රහසිගත අයුරින් ඉටුවිය යුතු මෙම සියලු කටයුතු නියමිත දිනට, විභාග අපේක්ෂකයන්ගේ ප්‍රමාණය අනුව සකස් විය යුතු අතර, කිසිදු මුද්‍රණ දෝෂයක් සිදු නොවන අයුරින් සිදුවිය යුතු ඉතා සංකීර්ණ ක්‍රියාවලියකි. අ.පො.ස. (සා.පෙළ) සහ අ.පො.ස. (උ.පෙළ) විභාග සඳහා ලක්ෂ සංඛ්‍යාත පාසල් සහ බාහිර අපේක්ෂකයින් පෙනී සිටින අතර ඒ ඒ විභාගවල විෂයයන් රාශියක් සඳහා ප්‍රශ්නපත්‍ර භාෂා ත්‍රිත්වයෙන් ම මුද්‍රණය කෙරේ. දිවා රාත්‍රී දෙකෙහි ම සේවය කරන මෙම ශාඛාවේ නිලධාරීන් හා සේවකයන් අතිශයින් දුෂ්කර වූ මෙහෙවරක නිරත ව සිටිති.

මෙම ශාඛාව මගින් 2018 වර්ෂයේදී මුද්‍රණය කරන ලද ප්‍රශ්න පත්‍ර සංඛ්‍යා පහත පරිදි වේ.

| **මුද්‍රණය කරන ලද රහස්‍ය ලේඛන** | **සංඛ්‍යාව** |
|---|---|
| 2018 අ.පො.ස. (උසස් පෙළ) විභාග සඳහා මාධ්‍ය තුනෙන් මුද්‍රණය කරන ලද ප්‍රශ්නපත්‍ර | 4,114,030 |
| 2018 අ.පො.ස. (උසස් පෙළ) විභාගය සඳහා මාධ්‍ය තුනෙන් පොත් වශයෙන් මුද්‍රණය කරන ලද ප්‍රශ්නපත්‍ර | 2,586,560 |
| 2018 අ.පො.ස. (උසස් පෙළ) භූගෝල විද්‍යාව විෂය සඳහා මාධ්‍ය තුනෙන් වෙන් වෙන්ව මුද්‍රණය කරන ලද වර්ණ සිතියම් | 64,250 |
| 2018 අ.පො.ස. (උසස් පෙළ) විභාගය සඳහා මාධ්‍ය තුනට අදාළව කරන ලද වර්ණ චිත්‍ර සහිත ප්‍රශ්න පත්‍ර | 16,000 |
| 2018 වර්ෂයේ පහ ශ්‍රේණිය ශිෂ්‍යත්ව විභාගය සඳහා සිංහල සහ දෙමළ මාධ්‍යයෙන් මුද්‍රණය කරන ලද ප්‍රශ්න පත්‍ර | 748,700 |
| 2018 අ.පො.ස. (සාමාන්‍ය පෙළ) විභාගය සඳහා මාධ්‍ය තුනෙන් මුද්‍රණය කරන ලද ප්‍රශ්න පත්‍ර | 7,898,175 |
| 2018 අ.පො.ස. (සාමාන්‍ය පෙළ) විභාගය සඳහා මාධ්‍ය තුනෙන් ප්‍රශ්න පත්‍ර පොත් වශයෙන් මුද්‍රණය කරන ලද ප්‍රශ්නපත්‍ර | 2,004,750 |
| 2018 අ.පො.ස. (සාමාන්‍ය පෙළ) විභාගයේ චිත්‍ර කලාව විෂය සඳහා මාධ්‍ය තුනට අදාළව මුද්‍රණය කරන ලද වර්ණ චිත්‍ර සහිත ප්‍රශ්න පත්‍ර | 142,500 |
| 2018 අ.පො.ස. (සාමාන්‍ය පෙළ) විභාගයේ භූගෝල විද්‍යාව විෂය සඳහා මාධ්‍ය තුනට අදාළව මුද්‍රණය කරන ලද වර්ණ සිතියම් | 118,500 |
| 2018 වර්ෂයේ වෙනත් විභාග සඳහා මාධ්‍ය තුනෙන් මුද්‍රණය කරන ලද ප්‍රශ්න පත්‍ර | 735,950 |
| **මුළු එකතුව** | **18,429,415** |

## 2.15.2 මුද්‍රණාලය (රහස්‍ය නොවන)

මෙම දෙපාර්තමේන්තුවේ රහස්‍ය නොවන මුද්‍රණාලය මගින් සිදු කෙරෙන කාර්යයන් රාශියක් වේ. විශේෂයෙන්ම විභාගවලට අවශ්‍ය උපදෙස් පත්‍රිකා, විවිධ විභාග සඳහා සහතික පත්‍ර, විවිධ ලේබල් සහ අනෙකුත් විවිධ පෝරම වර්ග ආදිය මෙම මුද්‍රණාලයෙන් මුද්‍රණය වේ.

| 2018 වර්ෂයේ මුද්‍රණය කරන ලද වෙනත් ලිපි ලේඛන (රහස්‍ය නොවන) | සංඛ්‍යාව |
|---|---|
| විභාගවලට අවශ්‍ය ජර්නල් හා උපදෙස් පොත් | 84,750 |
| විවිධ විභාග සඳහා සහතික | 124,652 |
| සහතික පත්‍ර ශාඛාව වෙනුවෙන් මුද්‍රණය කරන ලද සහතික පත්‍ර | 335,000 |
| විවිධ ලේබල් | 3,869,900 |
| විවිධ පෝරම | 4,468,710 |
| ගොනු කවර මුද්‍රණය | 16,300 |
| කවර මුද්‍රණය | 838,300 |
| ප්‍රතිඵල ලේඛන / ප්‍රතිඵල සටහන් මුද්‍රණය | 223,440 |
| ශාඛා සඳහා පොත් බැඳීම | 5,827 |
| වෙනත් විවිධ මුද්‍රණ | 1,421,048 |
| **මුළු එකතුව** | **11,387,927** |

## 2.16 පරිගණක ශාඛාව

පාසල් විභාග, ගුරු විද්‍යාල විභාග, දහම් පාසල් හා පිරිවෙන් විභාග සහ ආයතනික විභාග (දත්ත පරිගණක ගත කිරීමෙන් පවත්වනු ලබන ආයතනික විභාග) සම්බන්ධ කටයුතු සිදුකිරීම මෙම ශාඛාව මගින් සිදු කරනු ලැබේ.

එමෙන්ම විභාග පැවැත්වීමට අදාළව විභාග අයදුම්පත්‍ර ගැසට් නිවේදන සඳහා නිරීක්ෂණ ලබාදීම, එක් එක් විභාගයට සුවිශේෂී වන අන්දමින් පද්ධති විශ්ලේෂණය, පරිගණක වැඩසටහන් සකස් කිරීම හා ක්‍රියාත්මක කිරීම, දත්ත සංස්කරණ ලේඛන, ප්‍රවේශ පත්‍ර ඇතුළුව විභාග පැවැත්වීමට අදාළ ලේඛන මුද්‍රණය කර අදාළ ශාඛා වෙත නිකුත් කිරීම පරිගණක ශාඛාවෙන් සිදු කෙරේ.

ප්‍රතිඵල සැකසීමට අදාළ පරිගණක වැඩසටහන් සකස් කිරීම හා ක්‍රියාත්මක කිරීම, පාසල් විභාගවල ඇගයීම් ක්‍රියාවලිය සඳහා අවශ්‍ය පරිගණක ලේඛන හා ප්‍රතිඵල නිකුත් කිරීමට පෙර පරීක්ෂා කිරීම් සඳහා විවිධ ලේඛන අදාළ ශාඛා වෙත නිකුත් කිරීම, ප්‍රතිඵල සැකසීම හා අධීක්ෂණ කමිටු සම්බන්ධීකරණය යන ක්‍රියාවලිය පරිගණක ශාඛාවේ කාර්යභාරය ලෙස හඳුන්වා දිය හැකිය. ප්‍රතිඵල ලබාදීමට පෙර ආයතනික විභාග සඳහා අදාළ විභාගවල අවශ්‍යතා මත සම්මුඛ පරීක්ෂණ ලේඛන, ප්‍රමුඛතා ලේඛන, ඌණතා ලේඛන, අවසන් ප්‍රතිඵල ආදිය සකසා ප්‍රතිඵල ශාඛාව වෙත ලබාදීම, පාසල් විභාග සඳහා ප්‍රතිඵල ලේඛන පාසල් විභාග සංවිධාන ශාඛාව වෙත ලබාදීම මෙම ක්‍රියාවලිය තුළ වැදගත් පියවර වේ.

සහතිකපත්‍ර නිකුත් කරනු ලබන විභාගවලට අදාළව කටයුතු කිරීමේදී අ.පො.ස. (සා/පෙළ), අ.පො.ස. (උ/පෙළ) විභාග, දහම් පාසල් හා පිරිවෙන් විභාග, ධර්මාචාර්ය, ගුරු විද්‍යාල විභාග අයදුම්කරුවන් සඳහා කේවල සහතිකපත්‍ර ද,

ආයතනික විභාග අයදුම්කරුවන් සඳහා කේවල ප්‍රතිඵල ලේඛන ද මුද්‍රණය කර අදාළ ශාඛා වෙත නිකුත් කිරීම තුළින් සහතිකකරණ ක්‍රියාවලිය සඳහා ද විශේෂ දායකත්වයක් සපයනු ලැබේ.

විවිධ අවශ්‍යතා සඳහා දත්ත ගොනු ලබා දීම ද මෙම ශාඛාව මගින් සිදුවේ. පාසල්, කලාප, පළාත් සහ ජාතික මට්ටමේ සාධන තත්ත්වය පිළිබඳ දත්ත ගොනු සහ වාර්තා, පාසල් විභාග සංවිධාන ශාඛාවටත්, පර්යේෂණ හා සංවර්ධන ශාඛාවටත් අවශ්‍ය පරිදි ලබා දීම සහ අධ්‍යාපන අමාත්‍යාංශයට අදාළ වාර්තා නිකුත් කිරීම සිදු කරනු ලබන අතර රාජ්‍ය හා රාජ්‍ය නොවන ආයතනවලින් ඵලදායී කාර්යයන් ප්‍රවර්ධනය සඳහා කරනු ලබන ඉල්ලීම් මත විභාගවලට අදාළ කුසලතා තොරතුරු හා විශ්ලේෂණ වාර්තා ලබාදීම ද සිදු කෙරේ.

මෙහි සිදුවන තවත් සුවිශේෂී කාර්යයක් වන්නේ තොරතුරු පද්ධති සංවර්ධනය කිරීම හා සම්බන්ධීකරණය කිරීමයි. මෙම ශාඛාව මගින් සිදු කරනු ලබන තවත් ප්‍රධාන කාර්යයන් කිහිපයකි.

01. දත්ත සටහන් හා සහතිකපත්‍ර ශාඛාවල අවශ්‍යතා අනුව පරිගණක පද්ධතියේ සම්බන්ධතාව ලබා දීම.

02. AS400 පද්ධති සම්බන්ධව IBM ආයතනය මගින් සිදු කරනු ලබන සේවා හා නඩත්තු කටයුතු සම්බන්ධීකරණය කිරීම.

03. AS400 පද්ධතිය හා සම්බන්ධ කර ඇති ප්‍රධාන මුද්‍රණ යන්ත්‍ර සම්බන්ධව අදාළ සේවා සැපයුම් ආයතන මගින් සිදු කරන සේවා හා නඩත්තු කටයුතු සම්බන්ධීකරණය කිරීම.

04. දත්ත සටහන් ශාඛාව හා සම්බන්ධීකරණය පවත්වා ගනිමින් විවිධ විභාගවලට අදාළ පරිගණක වැඩසටහන් සංවර්ධනය කර ලබා දීම.

05. දෙපාර්තමේන්තු වෙබ් අඩවිය කාලීන අවශ්‍යතා යාවත්කාලීන කිරීම.

06. දත්ත සුරක්ෂණය සහ ගබඩා කිරීම පරිගණක ශාඛාවෙන් සිදුවන කාර්යයකි. දිනපතා දත්ත උපස්ථ (Back up) ගැනීම හා මහරගම ජාතික අධ්‍යාපන ආයතනයේ ස්ථාපිත කර ඇති මෙම දෙපාර්තමේන්තුවේ ආපදා කළමනාකරණ පද්ධතිය (Disaster recovery system) තුළ එම දත්ත ගබඩා කිරීම.

07. AS400 ප්‍රධාන පද්ධතියේ දත්ත, දත්ත සටහන් පද්ධතියේ, සහතිකපත්‍ර පද්ධතියේ යාවත්කාලීන කිරීම.

08. උක්ත 07 හි සඳහන් පද්ධතිවල හා ආපදා කළමනාකරණ පද්ධතියේ දත්ත ආරක්ෂාව පිළිබඳ සුපරීක්ෂණය.

09. දෙපාර්තමේන්තුවේ පවතින AS400 පද්ධතිය හා ජාතික අධ්‍යාපන ආයතනයේ පවතින ආපදා කළමනාකරණ පද්ධතියට අදාළ මෙහෙයුම් පද්ධතිය (OS) 2017 වසරේදී V5R4 සිට V7R1 වෙත යාවත්කාලීන හා වැඩි දියුණු කර ඇත. ඒ අනුව අදාළ පද්ධතිය අවශ්‍යතාව අනුව සංවර්ධනය කිරීම.

10. දෙපාර්තමේන්තු වෙබ් අඩවිය වැඩිදුරටත් සංවර්ධනය කිරීම. (දැනට සංවර්ධනය කර ඇති Cloud වලට ප්‍රවේශ වීම හා ඉදිරි කටයුතුවලට අදාළව)

## 2019 වර්ෂයට හා ඉන් ඉදිරියට සිදු කිරීමට අපේක්ෂිත වැඩසටහන්

01. SMS පණිවිඩ මගින් සම්පත්දායකයන්, අදාළ පාර්ශව හා අපේක්ෂකයන් වෙත තොරතුරු ක්ෂණිකව ලබාදීමේ වැඩපිළිවෙල ආරම්භ කිරීම හා පවත්වාගෙන යාම.

02. ලංකා රාජ්‍ය ජාල ව්‍යාප්තියේ 2.0 (LGN) යටතේ දෙපාර්තමේන්තුව තුළ ශක්තිමත් Wi-Fi ජාලයක් ස්ථාපිත කිරීම.

03. තෝරාගත් විභාග සඳහා ශ්‍රී ලංකා තැපැල් දෙපාර්තමේන්තුව සහ වෙනත් රාජ්‍ය ආයතන සමඟ ඒකාබද්ධව මාර්ගගත (online) සේවාවක් ඇති කිරීමට අවශ්‍ය මූලික කටයුතු සිදු කිරීම.

04. දෙපාර්තමේන්තුව සඳහා ජාතික විශ්වවිද්‍යාල පද්ධතිය සමඟ සම්බන්ධ වී තොරතුරු පද්ධතියක් සංවර්ධනය කිරීමට කටයුතු ආරම්භ කිරීම.

05. මානව සම්පත් යාවත්කාලීන කිරීම සහ ධාරිතා සංවර්ධනය සඳහා අවශ්‍යවන ශාඛාවේ නිලධාරීන් විශේෂිත පුහුණු පාඨමාලාවලට යොමු කරවීම සඳහා කටයුතු ආරම්භ කිරීම.

i. මාර්ගගත (Online) විභාග පැවැත්වීම හා කළමනාකරණය
ii. ලේඛන ඩිජිටල්කරණය
iii. Cloud Computing හා සම්බන්ධ දත්ත සුරක්ෂණ ක්‍රමවේද හා ප්‍රතිභාවිත
iv. ජාල පද්ධති කළමනාකරණය
v. දත්ත සුරක්ෂණය හා කළමනාකරණය

## 2.17 දත්ත සටහන් ශාඛාව

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුවෙන් පරිගණක ගතකර පවත්වනු ලබන සියලුම විභාග සම්බන්ධ දත්ත සහ ඒවායේ සංශෝධන සටහන් කිරීම හා එම විභාග සඳහා පෙනී සිටින අපේක්ෂකයන්ගේ ලකුණු සටහන් කිරීම මෙම ශාඛාවේ කාර්යභාරය වේ. මෙහිදී පාසල් විභාග සංවිධාන හා ප්‍රතිඵල, ඇගයීම් (පාසල් විභාග), සංවිධාන හා විදේශ විභාග සහ ප්‍රතිඵල (ආයතනික විභාග) යන ශාඛා මගින් අදාළ තොරතුරු මෙම ශාඛාව වෙත සපයනු ලැබේ.

## 2.18 සැලසුම් ක්‍රියාත්මක කිරීමේ හා නියාමන ශාඛාව

දෙපාර්තමේන්තුවට අදාළ වාර්ෂික වාර්තා ක්‍රියාත්මක කිරීමේ හා මධ්‍යකාලීන අධ්‍යාපන ආංශික සැලැස්ම සකස් කර අධ්‍යාපන අමාත්‍යාංශය වෙත ඉදිරිපත් කර ඇත.

දෙපාර්තමේන්තුවේ සියලුම ශාඛාවලින් මාසික සැලසුම් හා ඉටුකළ වැඩ වාර්තා ලබා ගැනීම මගින් මෙම සැලැස්ම, නියාමන කටයුතු සිදු කරනු ලැබේ. මෙම වාර්තා මාසිකව, ත්‍රෛමාසිකව, වාර්ෂිකව සකස්කර විභාග කොමසාරිස් ජනරාල් වෙත ඉදිරිපත් කරනු ලැබේ.

දෙපාර්තමේන්තුවේ ප්‍රසම්පාදන සැලැස්ම සැකසීමට අවශ්‍ය භෞතික සම්පත් සැලැස්ම වාර්ෂිකව සකස් කර ඇත.

අධ්‍යාපන අමාත්‍යාංශය මගින් මෙම දෙපාර්තමේන්තුවේ ප්‍රතිසංස්කරණය සඳහා පත්කරනු ලැබූ විද්වත් කමිටු වාර්තාවේ නිර්දේශ ක්‍රියාත්මක කිරීම සඳහා ක්‍රමෝපායික සැලැස්මක් සකස් කර එය ක්‍රියාවට නැංවීමට අවශ්‍ය කටයුතු සම්පාදනය කර ඇත. මෙමගින් විභාග කළමනාකරණ ක්‍රියාවලිය ඩිජිටල්කරණයට ලක්කිරීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගනිමින් පවතී.

### වෘත්තීය සංවර්ධන වැඩසටහන්

2018 අ.පො.ස. (උ/පෙළ) හා අ.පො.ස. (සා/පෙළ) විභාග සඳහා අතිරේක ශාලාධිපතිවරු යෙදවීමට අවශ්‍ය කටයුතු සිදුකරනු ලැබිණි. ඒ සඳහා නිලධාරීන් 1008 දෙනෙක් පුහුණු කර විභාග මධ්‍යස්ථානවල සේවය සඳහා යොදවන ලදි.

විභාග ශාලාධිපතිවරුන් ලෙස කටයුතු කිරීමට පුහුණුව ලබාදෙනු ලැබූ ශ්‍රී ලංකා විදුහල්පති සේවයේ III ශ්‍රේණියේ නිලධාරීන්ගේ තොරතුරු පිළිබඳ දත්ත පද්ධතියක් යාවත්කාලීනව පවත්වා ගැනීමට කටයුතු කර ඇත. පාසල් විභාග හා ආයතනික විභාග පැවැත්වීමට මෙම පුහුණු කරන ලද නිලධාරීන් යොදවා ගනු ලැබේ. ශ්‍රී ලංකා අධ්‍යාපන පරිපාලන සේවයේ (සීමිත) විභාගයෙන් බඳවා ගනු

ලැබූ නිලධාරීන් 108 දෙනෙකු හා ශ්‍රී ලංකා ගුරු අධ්‍යාපනඥ සේවයේ නවක නිලධාරීන් 23 දෙනෙකු සඳහා විභාග දෙපාර්තමේන්තුවේ කාර්යභාරය පිළිබඳව දැනුවත් කිරීමේ පුහුණු වැඩමුළු පවත්වා ඇත.

දෙපාර්තමේන්තුවේ මාණ්ඩලික ශ්‍රේණියේ නිලධාරීන් 12 දෙනෙකු හා තොරතුරු තාක්ෂණ සේවයේ නිලධාරීන් 07 දෙනෙකු University Putra Malaysia හි දී Online Examinations Management වැඩසටහනට සහභාගී කරවීය. මෙමගින් විදේශීය රටවල විභාග පැවැත්වීමට භාවිතා කරනු ලබන නව ක්‍රමවේදයන් පිළිබඳව අවබෝධයක් ලබා ගැනීම අපේක්ෂා කරනු ලැබුණි.

දෙපාර්තමේන්තුවේ මාණ්ඩලික නිලධාරීන්ට නායකත්ව කුසලතාවයන් ඉහළ නැංවීම සඳහා අවශ්‍ය Out Bound Training වැඩසටහනක් පවත්වන ලදි.

දෙපාර්තමේන්තුවේ සේවයට පැමිණෙන ශ්‍රී ලංකා අධ්‍යාපන පරිපාලන සේවයේ නව නිලධාරීන්ට අවශ්‍ය වෘත්තීය මග පෙන්වීමේ අරමුණින් මොඩියුල 6ක් මුද්‍රණය කර ඇති අතර ඒ අනුව පුහුණු වැඩසටහන් පවත්වනු ලැබේ.

කළමනාකරණ සේවා නිලධාරි සේවයේ නිලධාරීන් 108 දෙනෙකු සඳහාද කාර්යාල කළමනාකරණය පිළිබඳව පුහුණු වැඩසටහන් පවත්වා ඇත.

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව සඳහා කාර්ය පටිපාටික රීති සංග්‍රහයක් සකස් කර මුද්‍රණය කිරීමට කටයුතු යොදා ඇත.

දෙපාර්තමේන්තු පරිශ්‍රයේ නව සය මහල් බහු කාර්යය ගොඩනැගිල්ල ඉදි කිරීමේ කටයුතු නියාමනය කරනු ලබන අතර මෙම ගොඩනැගිල්ල නවීන විභාග ශාලා, නවීන ඇගයීම් ශාලා හා බහු කාර්යය ශ්‍රවණාගාරයක් වැනි පහසුකම්වලින් සමන්විත වේ.

| | |
|---|---|
| ▪ ඉදිකිරීම් ආරම්භ කළ දිනය | 2017.02.02 |
| ▪ අවසන් කර භාරදිය යුතු දිනය | 2019.02.02 |
| ▪ ඇස්තමේන්තුගත පිරිවැය | රු. මිලියන 615 |
| ▪ ඉදිකිරීම් ආයතනය | රාජ්‍ය ඉංජිනේරු සංස්ථාව (SEC) |
| ▪ උපදේශන සේවා ආයතනය | ඉංජිනේරුමය කාර්යයන් පිළිබඳ මධ්‍යම උපදේශන කාර්යාංශය (CECB) |
| ▪ දැනට දරා ඇති වියදම | රු. මිලියන 237.5 |